# ඝන අපද්‍රව්‍යය කලමනාකරණය පිලිබඳ අතුරු නීතියකි.

**ගාල්ල මහනගරසභාවේ පරිපාලන ප්‍රදේශය තුල ප්‍රසිද්ධ ස්ථානයන්හි පෞද්ගලික පරිශ්‍රයන්හි, වීථි වල, මංමාවත්වල ජනනය වන ඝන අපද්‍රව්‍ය වෙන් කිරීම, ගබඩා කිරීම, එක්රැස් කිරීම, ප්‍රවාහනය කිරීම, මාරු කරන ස්ථාන ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම, සැකසීම, පිරියම් කිරීම හා බැහැර කිරීම සම්බන්ධයෙන් වන නියාමනය, අධීක්ෂණය, පරීක්ෂාව හා පාලනය සඳහා වූ අතුරු නීතියකි.**

මහනගර සභා ආඥා පනතේ (252 වන අධිකාරය) 267 වන වගන්තිය සමග කියවිය යුතු එකී ආඥාපනතේ 129 වැනි වගන්තිය සහ 272 වැනි වගන්තියේ 5 වන උපවගන්තියේ (ආ) ජේදයේ ඝන අපද්‍රව්‍යය කලමණාකරනය පිලිබඳ අතුරු ව්‍යවස්ථා පැනවීමට මහ නගරසභාවට බලය පැවරී ඇති අතර ඒ අනුව මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලැබේ.

## සාමාන්‍යය

1. මෙම අතුරු ව්‍යවස්ථාව ගාල්ල මහා නගර සභාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිලිබඳ අතුරු ව්‍යවස්ථා ලෙස සඳහන් කරනු ලැබේ.
2. ගාල්ල මහා නගර සභාවේ නාගරික සීමාවන් ඇතුළත ප්‍රසිද්ධ ස්ථානයන්හි, පෞද්ගලික පරිශ්‍රයන්හි, වීථි වල, මංමාවත්වල ජනනය වන ඝන අපද්‍රව්‍ය වෙන් කිරීම, ගබඩා කිරීම, එක්රැස් කිරීම, ප්‍රවාහනය කිරීම, මාරු කරන ස්ථාන ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම, සැකසීම, පිරියම් කිරීම හා බැහැර කිරීම සම්බන්ධයෙන් වන නියාමනය, අධීක්ෂණය, පරීක්ෂාව හා පාලනය සඳහා මෙම අතුරු ව්‍යවස්ථා පනවනු ලැබේ.
3. ගාල්ල මහා නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටි යම් පරිශ්‍රයක සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම තම පරිශ්‍රය අපද්‍රව්‍යවලින් තොර සෞඛ්‍ය සම්පන්න හා ප්‍රසන්න තත්ත්වයෙන් තබා ගත යුත්තේ ය.
4. ගාල්ල මහා නගර සභා බල ප්‍රදේශයේ පිහිටි යම් පරිශ්‍රයක හිමිකරු හෝ පදිංචිකරු තම පරිශ්‍රය ඇතුළත ජනනය වන්නා වූ අපද්‍රව්‍ය එක්රැස් කිරීම, වෙන් කිරීම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම හා බැහැර කිරීම කළ යුත්තේ ය. නැති නම් මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන වලට අනුකූලව එසේ කරවිය යුත්තේ ය.
5. (i) පරිශ්‍රයක සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම ඔහුගේ/ඇයගේ පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ ඝන අපද්‍රව්‍යය පුද්ගලයෙකුට හෝ පිරිසකට හෝ පරිසරයට හානියක් නොවන ආකාරයට ගාල්ල මහා නගර සභාව විසින් නිර්දේශ කරන ක්‍රමවේදයකට අනුකූලව මෙහි **උපලේඛනය** 1 දැක්වෙන ආකාරයට සුදුසු ක්‍රමයක් භාවිතා කරමින් දෛනිකව නැති නම් ඊට වඩා අඩු කාලාන්තරයෙන් එක්රැස් කළ යුත්තේ ය.

   (ii) සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ පූර්වගාමී උපවගන්තිය අනුව එක්රැස් කරනු ලැබූ අපද්‍රව්‍ය අංක 8 සිට 24 දක්වා වන අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන වලට අනුකූලව වෙන් කළ යුත්තේ ය. නැති නම් එසේ කිරීමට සැලැස්විය යුත්තේ ය.

(iii) හිමිකරු හෝ පදිංචිකරු විසින් අපද්‍රව්‍ය ගබඩා කිරීම හෝ මුදා හැරීම සඳහා භාවිතා කරනු ලබන යම් දිරන කසල මල්ලක්, උරයක්, විශාල බඳුනක් හෝ වෙනත් දිරන කසල බහාලුමක් අංක 8 සිට 24 දක්වා වන අතුරු ව්‍යවස්ථාවල විධි විධාන යටතේ එක් රැස් කරනු ලැබීම පිණිස හොඳ තත්ත්වයෙන් නඩත්තු කරනු ලැබිය යුත්තේ ය. ඒවා ඉරී, සිදුරු වී. කැඩී හෝ එකදිගට තෙතමනයට නිරාවරණය වීම නිසා මොළොක් වී හෝ වෙන යම් හේතුවක් නිසා සාධාරණ ලෙස පරිහරණය කරන විට පරිසරයට විසිරියන පරිදි කඩා වැටීමට හෝ බිඳී යාමට හැකි තත්ත්වයේ තිබේ නම් එක්රැස් කරනු ලැබීම පිණිස භාවිතා නොකළ යුත්තේ ය. හිමිකරුවන් හෝ පදිංචිකරුවන් අපේක්ෂා කරන්නේ නම් සභාව විසින් ගනු ලබන තීරණයක් අනුව කොටසක් සහනාධාරයක් වශයෙන් හෝ සම්පූර්ණයෙන්ම සහනාධාරයක් වශයෙන් දිරන කසල බහාලුම් සභාවෙන්ම සැපයිය හැකිය.

(iv) 5 (i) උපවගන්තියේ විධිවිධාන වල සඳහන් ආකාරයට එක්රැස් කරන ලද අපද්‍රව්‍ය සභාව විසින් කලින් කලට තීරණය කර ප්‍රසිද්ධ කරනු ලැබූ ගාල්ල මහ නගර සභා සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන්නා වූ අපද්‍රව්‍ය එක් රැස් කිරීමේ ක්‍රමයට හා කාල සටහනට අනුකූලව හිමිකරු හෝ පදිංචිකරු විසින් බැහැර කළ යුත්තේ ය.

(v) හිමිකරු හෝ පදිංචිකරු නිවැසියන්ගේ අමුත්තන්ගේ හෝ අසල්වැසියන්ගේ සෞඛ්‍යට හෝ එම ප්‍රදේශයේ සනීපාරක්ෂක තත්ත්වයට හානිකර හෝ අන්තරායකාරී වන අන්දමින් ජනනය වීමට ඉඩහැරීම, අපද්‍රව්‍යය එක් රැස් කිරීම, ගබඩා කිරීම හෝ බැහැරලීම නොකළ යුත්තේ ය.

6. (i) කිසිම තැනැත්තෙක්, වීථියකට, පාරකට, මංමාවතකට, පටුමාවතකට, මාවතකට හෝ වෙනත් පොදු ස්ථානයකට හෝ පරිශ්‍රයකට හෝ කාණුවකට හෝ ජල මාර්ගයකට හෝ ජලාශයකට හෝ මුහුදට අපද්‍රව්‍ය සහ ක්ෂරිත මුදාහැරීම නොකළ යුත්තේ ය.

(ii) කිසියම් තැනැත්තෙක් ගාල්ල මහා නගර සභා ප්‍රදේශය තුළ විවෘත භූමියක පරිසරයට හානිකර වන අන්දමින් අපද්‍රව්‍ය පිළිස්සීම නොකළ යුත්තේ ය.

(iii) යම් හිමිකරුවෙක් හෝ පදිංචිකරුවෙක් අංක 7 දරන අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර යම් අපද්‍රව්‍ය වර්ගයක්, මුදා හැරීම, පිරියම් කිරීම. සැකසීම හෝ බැහැරලීම සඳහා අවසර ලබා ගැනීමට සිදුවන අවස්ථාවක දී එසේ අවසර ගැනීමට අපොහොසත් වේ නම් ඔහුට / ඇයට එම අපද්‍රව්‍ය ලියාපදිංචි අපද්‍රව්‍ය එක් රැස් කරන්නකුට භාරදිය හැකි ය.

(iv) අංක 7 දරන අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ සැකසීම. පිරියම් කිරීම හෝ බැහැරලීම හෝ නොකරනු ලැබූ අපද්‍රව්‍ය ඉහත (7.iv) හි විධිවිධාන යටතේ යම් ගාල්ල මහා නගරසභාවේ ලියාපදිංචි අපද්‍රව්‍ය එක් රැස් කරන්නකු විසින් එක්රැස් කරන ලද යම් අපද්‍රව්‍ය වර්ගයක් අංක 8 සිට 24 දක්වා වන අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන වලට අනුකූලව ඉවත් කරනු ලැබිය යුත්තේ ය.

7. (i) යම් පරිශ්‍රයක හිමිකරුට හෝ පදිංචිකරුට පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් හැර අපද්‍රව්‍ය එම පරිශ්‍රය ඇතුළතම කළමණාකරණය කිරීම සිදුකල යුතුය.

(අ) ගාල්ල මහා නගර සභාව විසින විසින් එවැනි අපද්‍රව්‍ය බැහැරලීම තහනම් කර ඇති ප්‍රදේශයන්හි, එනම් මෙම ලේඛනයේ **උපලේඛනය 2** දක්වා ඇති නිස්චිත ප්‍රදේශ.

(ආ) ගාල්ල මහා නගර සභාව විසින විසින් නිශ්චිතව නියම කරනු ලැබ ඇති ඇතැම් අපද්‍රව්‍ය වර්ග. ( මෙහි **උපලේඛනය 6** දක්වා ඇති සායනික අපද්‍රව්‍යය භාවිතයෙන් ඉවත්කරනු ලැබූ බෙහෙත් ද්‍රව්‍යය, ඉවතලනු ලැබූ විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික් අන්තරායදායක අපද්‍රව්‍යය වැනි ද්‍රව්‍යය)

(ii) පරිශ්‍රයක හිමිකරුට හෝ පදිංචිකරුට මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශ වලට අනුකූලව සකස් කරනලද ගාල්ල මහා නගර සභාව විසින් අනුමත කරන ලද සැලසුමකට හා ප්‍රමිතියට අනුකූලව ඉදිකරනු ලැබූ දාහකයක හෝ පෝරණුවක අපද්‍රව්‍ය පිළිස්සිය හැකි ය. නැතිනම් මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශයන්ට අනුකූලව ගාල්ල මහ නගරසභාව විසින් අනුමත කරනුලැබූ ආකාරයට අපද්‍රව්‍ය පිරියම් කිරීම, සැකසීම හෝ වැළලීම කළ හැකි ය.

(iii) යම් හිමිකරුවකු හෝ පදිංචිකරුවකු ''කොම්පෝස්ට් බඳුන්'' සඳහා කොමසාරිස් වරයා වෙතින් ඉල්ලීමක් කළහොත් ඒ හිමිකරුට හෝ පදිංචිකරුට එම කොම්පෝස්ට් බඳුන් නඩත්තු කිරීම සඳහා ප්‍රමාණවත් ඉඩ කඩක් පරිශ්‍රය තුළ තිබේනම් කොමසාරිස් වරයා එම කොම්පෝස්ට් බඳුන්වල පිරිවැයෙන් කොටසක් හෝ මුළුමනින්ම හෝ සහනාධාරයක් වශයෙන් ලබා දීම ගාල්ල මහා නගර සභාවේ නිලධාරීන් විසින් සිදුකරනු ලබන ශක්‍යයතා අධ්‍යනයකට පසුව එම කොම්පෝස්ට් බඳුන් හිමිකරුට හෝ පදිංචිකරුට සැපයිය හැකිය. එසේ කොම්පෝස්ට් බඳුන් සපයා ඇති ප්‍රදේශ වලට අදාලව යම් විශේෂ තත්වයක් යටතේ නාගරික කොමසාරිස් වරයාගේ පූර්න අනුමැතිය සහිතව මිස එකී පරිශ්‍ර වල ගෘහස්ථ කසල ගාල්ල මහා නගරසභාව විසින් භාර නොගනු ඇත.

(iv) හිමිකරු හෝ පදිංචිකරු පරිශ්‍රය ඇතුළත එකතුවන "ගෙවතු අපද්‍රව්‍ය'' හැකිතාක් දුරට කොමසාරිස් වරයා විසින් අනුමත කරන ලද ආකාරයට සැකසීම හෝ පිරියම් කිරීම හෝ කළ යුත්තේ ය. එම හිමිකරු හෝ පදිංචිකරු ඉතිරිවන යම් ගෙවතු අපද්‍රව්‍යයක් වේ නම් එය බැහැරලීමට ඇති අපද්‍රව්‍යවල ස්වභාවය සැලකිල්ලට ගෙන සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි මෙහි **උපලේඛනය 3** සඳහන් නියමිත ගාස්තුවක් ගෙවීම මත ගාල්ල මහනගර සභාවට භාරදිය යුත්තේ ය.

(v) වීථියක හෝ මංමාවතක යාබදව පිහිටි යම් ගසක්, හෝ ගසක කොටසක් කපන යම් තැනැත්තෙක් වහාම එය ඉවත් කළ යුත්තේ ය. නැතිනම් ඉවත් කිරීමට සැලැස්විය යුත්තේ ය. එසේත් නැතිනම් සභාව විසින් තීරණය කරනු ලබන ගෙවීමක් මත ගාල්ල මහ නගර සභාවට භාරදිය යුත්තේ ය.

(vi) සෑම තැනැත්තෙක්ම ඔහුගේ/ඇයගේ පාලනය යටතේ සිටින යම් සතකු වීථියක, මංමාවතක හෝ පොදු ස්ථානයක මළපහ කිරීම වැළැක්වීමට පියවර ගත යුත්තේ ය. එසේ මළපහ කරනු ලැබුවහොත් අංක 8 සිට 24 දක්වා වන අතුරු ව්‍යවස්ථා වලට අනුකූලව එය පවිත්‍ර කොට බැහැරලීම ඒ තැනැත්තාගේ වගකීම වන්නේ ය.

(vii) කිසිම තැනැත්තෙක් නගර සභා ප්‍රදේශය තුළ කුමන වර්ගයක හෝ අපද්‍රව්‍යයක් වාහනයක සිට වීථියකට, මංමාවතකට හෝ පොදු ස්ථානයකට මුදා හැරීම හෝ එහි තැබීම නොකළ යුත්තේ ය.

(viii) නිවසක් හෝ වෙනත් යම් පරිශ්‍රයක් ඉදිකිරීමට හෝ අළුත්වැඩියා කිරීමට අයදුම් කරන යම් කෙනෙක් ඔහුගේ/ඇයගේ පරිශ්‍රය ඉදිකිරීමේදී හෝ අලුත්වැඩියා කිරීමේදී ජනනය වන ඝන අපද්‍රව්‍ය හා මුදා හරිනු ලබන ද්‍රව්‍ය. පිරියම් කරනු ලබන හා සකස් කරනු ලබන ආකාරය පිළිබඳ විස්තර ඔහුගේ/ඇයගේ අයදුම් පත්‍රයේ ඇතුළත් කළ යුත්තේ ය.

(ix) අ) නිවාස පරිශ්‍රයන් හැර අනෙකුත් සියලු පරිශ්‍රයන් සඳහා ගාල්ල මහා නගර සභාව විසින් භාරගනු ලබන කසල සඳහා ( එකී කසල ප්‍රමානය නිසි ලෙස කලමනාකරනය කිරීම සඳහා වැයවන පිරිවැයට සාපේක්ෂව සහ බැහැර කරනු ලබන කසල ප්‍රමානයේ බර අනුව පදනම් වූ ) යම් අයකිරීමක් කලින් කලට ගාල්ල මහා නගර සභාව විසින් නියම කරනු ලබන අතර එම මුදල ගෙවීම අදාල පරිශ්‍රයේ පදිංචි කරුවන්ගේ වගකීමක් වන්නේය.

ආ) නිවාස පරිශ්‍රයන් විසින් බැහැරකරනු ලබන අතුරු ව්‍යවස්ථාවේ **උපලේඛනය 4** දැක්වෙන ආකාරයේ ගෘහස්ථ කසල ගණයට අයත් නොවන නිවාස පරිශ්‍රයන් හි ජනිත වන්නා වූ කසල වර්ග සඳහා ඉහත දැක්වෙන පදනමින් අයකිරීමක් නියම කරන ලද විට එම මුදල ගෙවීම අදාල පරිශ්‍රයේ පදිංචි කරුගේ වගකීමක් වන්නේය.

(x) ගාල්ල මහනගර සභාව විසින් නිවාස පරිශ්‍රයන් වලින් ජනිත වන්නා වූ ගෘහස්ථ කසල සඳහා තාක්ෂණික පදනමක් යටතේ නිශ්චිත බරකට ආදාලව මෙහි **උපලේඛනය 5** දැක්වෙන ආකාරයට කසල භාරගන්නා අතර යම් හෙයකින් යම් ගෘහස්ථ පරිශ්‍රයක් දිගින් දිගටම අදාල උපරිම බරට වඩා වැඩි ප්‍රමානයකින් කසල ජනිත කරන බවට ගාල්ල මහා නගර සභාවට නිරීක්ෂනය වන්නා වූ විට අදාල පරිශ්‍රයේ පදිංචි කරු වෙත ගාල්ල මහා නගර සභාව විසින් නියමිත අයකිරීමක් නියම කරනු ලැබිය හැකිය. එසේ ගෙවීම නියම කරනු ලැබූ විට අදාල පරිශ්‍රයේ පදිංචි කරු විසින් අදාල ගාස්තුව ගෙවිය යුතු වන්නේය.

## නිවාස පරිශ්‍රයන්

8. (i) සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම අතුගෑමෙන් හෝ වෙනත් ක්‍රමයකින් ජනනය කරනු ලැබූ අපද්‍රව්‍ය පහත දැක්වෙන පරිදි තෝරා වෙන් කළ යුත්තේ ය

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය. ( මෙහි උපලේඛනය 7 දැක්වෙන අපද්‍රව්‍යය )

(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,

(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය, ( එනම් විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍යය හා අපද්‍රව්‍යය, සනීපාරක්ෂක අපද්‍රව්‍ය, සායනික අපද්‍රව්‍ය, ඉවතලන ඖෂධ වැනි මෙහි උපලේඛනය 6 දැක්වෙන අපද්‍රව්‍යය )

(ඈ) සතුන්ගේ මළකුණු, ශරීර කොටස් හා අසූචි.

(ඉ) ඉහත සඳහන් කාන්ඩ වලට අයත් නොවන අපද්‍රව්‍යය.

(ii) ඉහත කාන්ඩ වලට අයත් නොවන අපද්‍රව්‍යයක් ජනිත වූයේනම් ඒ පිලිබඳව අදාල ජනිත කරන්නා විසින් ගාල්ල මහා නගරසභාව වෙතින් ලිඛිත උපදෙස් ලබාගෙන ගාල්ල මහා නගරසභාව විසින් නගරසභාව ලබාදෙන ලිඛිත උපදෙස් වලට අනුකූලව කටයුතු කලයුතුය.

(iii) සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම එසේ තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙන වෙනම මලුවලට, බඳුන් වලට හෝ වෙනත් බහාලුම්වලට දැමිය යුතු අතර, ඒවා ඉවත් කරනු ලබන තෙක් ඒ සඳහා වෙන් කර ඇති ස්ථානයක තැබිය යුත්තේ ය. ආහාර අපද්‍රව්‍ය හා ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය තෙතමනය කාන්දු නොවන ද්‍රව්‍යයෙන් සාදනු ලැබූ සහ මීයන්, කෘමීන් හා අනෙකුත් සතුන් ඇතුළුවීම වළකමින් නිසි පරිදි වසනු ලැබූ බහාලුමක තැබිය යුත්තේ ය. සතුන්ගේ මළකුණු ශරීර කොටස් හෝ අසූචි ආශ්‍රිත අපද්‍රව්‍ය බැහැරලිය යුතු අපද්‍රව්‍යවල ස්වභාවය සැලකිල්ලට ගෙන නගර සභා ප්‍රදේශය සඳහා කලින් කලට සභාව විසින් තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් කොමසාරිස් වරයා වෙත ගෙවීම මත ගාල්ල මහා නගර සභාවට හෝ ගාල්ල මහා නගර සභාවේ බලය ලත් නාගරික අපද්‍රව්‍ය එක් රැස් කරන්නකුට භාරදිය යුත්තේ ය.

(iv) සෑම හිමිකරුවෙකුටම හෝ පදිංචිකරුවෙකුටම (i) ඡේදයේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ගාල්ල මහා නගර සභාවට හෝ ගාල්ල මහා නගර සභාවේ ලියාපදිංචි අපද්‍රව්‍ය එක් රැස් කරන්නකුට භාරදිය හැකිය. හිමිකරු හෝ පදිංචිකරු එසේ කිරීමට අපොහොසත් වන්නේ නම් ඔහු/ඇය (ඇ) අයිතමයේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ගය ද සමග අදාල අපද්‍රව්‍ය ගාල්ල මහා නගර සභාවේ ලියාපදිංචි නාගරික අපද්‍රව්‍ය එක් රැස් කරන්නකුට භාරදිය යුත්තේ ය. නැතිනම් ගාල්ල මහා නගර සභාව විසින් එක් එක් අපද්‍රව්‍ය වර්ගය සඳහා ඉදිකරනු ලැබ ඇති බක්කිවල හෝ එවැනි අපද්‍රව්‍ය සඳහා සභාව විසින් සපයනු ලැබ ඇති බක්කිවල හෝ බහාලුම්වල හෝ තැන්පත් කළ යුත්තේ ය.

9. (i) කුලී නිවැසියන් ගණනාවක් සහිත බහු මහල් ගොඩනැගිල්ලක සෑම අයිතිකරුවෙක්ම, කලමණාකරන මන්ඩලය හෝ පදිංචිකරුවෙක්ම ඔවුන්ගේ අපද්‍රව්‍ය පහත දැක්වෙන අයුරු තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය. (මෙහි උපලේඛනය 7 සඳහන් වන ද්‍රව්‍ය )

(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය.

(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය, ( එනම් විද්‍යුත් අපද්‍රව්‍යය සනීපාරක්ෂක අපද්‍රව්‍යය සායනික අපද්‍රව්‍යය ඉවතලන ඖෂධ වැනි මෙහි උපලේඛනය 6 දැක්වෙන අපද්‍රව්‍යය )

(ඈ) සතුන්ගේ මළකුණු, ශරීර කොටස් සහ අසූචි,

(ii) ඉහත කාන්ඩ වලට අයත් නොවන අපද්‍රව්‍යයක් ජනිත වූයේනම් ඒ පිලිබඳව අදාල ජනිත කරන්නා විසින් ගාල්ල මහා නගරසභාව වෙතින් ලිඛිත උපදෙස් ලබාගෙන ගාල්ල මහා නගරසභාව විසින් නගරසභාව ලබාදෙන ලිඛිත උපදෙස් වලට අනුකූලව කටයුතු කලයුතුය.

(iii) කසල ජනනය වීම අවම කිරීමට සහ ඉහත පරිදි වෙන්කරන ලද කසල එකතුකිරීම තාවකාලිකව ගබඩාකිරීම සහ බැහැර කිරීම පිලිබඳව පසුවිපරම් කිරීම මෙන්ම ජනනය වන කසල ප්‍රමානය පිලිබඳව දත්ත තොරතුරු මාසිකව මහනගර සභාව වෙත ලබාදීම වැනි කසල කලමනාකරන සැලසුමකට අදාල මහල් ගොඩනැගිල්ලේ සෑම අයිතිකරුවෙක්ම කලමණාකරන මන්ඩලය හෝ පදිංචි කරුවෙක්ම මහා නගර සභාව සමග එලඹිය යුතු වන්නේය. අදාල පරිශ්‍රයේ සෑම පදිංචිකරුවෙක්ම අදාල සැලසුම අනුගමනය කරන බවට ගිවිසුම් ගත විය යුත්තේය.

(iv) (i) වැනි ඡේදයේ නිශ්චිතව සඳහන් කර ඇති ගොඩනැගිල්ලක අයිතිකරු හෝ පදිංචිකරු, කොමසාරිස් වරයා විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට හා පිරිවිතරයන්ට අනුකූලව හතර වර්ගයක බහාලුම් සැපයිය යුතු අතර ඒවා පවිත්‍රව හා සනීපාරක්ෂක තත්ත්වයෙන් නඩත්තු කළ යුත්තේ ය.

(v) (i) වැනි උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ගොඩනැගිල්ලක හිමිකරු හෝ පදිංචිකරු (ii) වැනි උපවගන්තියේ විධි විධාන වලට අනුකූල වීමට අපොහොසත් වන අවස්ථාවක දී කොමසාරිස් වරයා විසින් දැනුම් දෙනු ලබන දිනයක දී හෝ ඊට පෙර අදාල බඳුන් හෝ බහාලුම් සපයන ලෙසට හිමිකරුට හෝ පදිංචිකරුට නියම කිරීමට කොමසාරිස් වරයාට බලය ඇත්තේ ය. කොමසාරිස් වරයාගේ නියමයන් අනුව ක්‍රියා කිරීම හිමිකරුගේ හෝ පදිංචිකරුගේ යුතුකම වන්නේ ය.

(vi) ගොඩනැගිල්ලේ බිමක හෝ මහලක හිමිකරු හෝ පදිංචිකරු තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය ඒ සඳහා තබා ඇති අදාල බඳුනකට හෝ බහාලුමකට දැමිය යුත්තේ ය.

(vii) මෙම අතුරු ව්‍යවස්ථාවේ i වැනි උපවගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග ඉවත් කිරීම බලයලත් එක්රැස් කරන්නකුගේ රාජකාරිය වන්නේ ය. එසේ ඉවත් කරනු නොලැබූ යම් අපද්‍රව්‍යයක් (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ද නාගරික අපද්‍රව්‍ය එක් රැස් කරන්නකුට භාරදිය යුත්තේ ය.

## අඩුපහසුකම් නිවාස

10. (i) සභාවේ පූර්ව අනුමැතිය ලබාගෙන අඩු පහසුකම් නිවැසියන්ගේ භාවිතය සඳහා කොමසාරිස් විසින් අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් නොමිලයේ සැපයීම නිත්‍යානුකූල වන අතර නිසි ලෙසට කසල බැහැර කිරීම සිදුවන ආකාරය පිලිබඳව ගාල්ල මහනගර සභාව අධීක්ෂනය කරනු ලබයි.

(ii) සෑම අඩු පහසුකම් සහිත නිවසකම හිමිකරු හෝ පදිංචිකරු ඔහුගේ / ඇයගේ වාසස්ථානයේ එකතු වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කර ඔහුගේ/ඇයගේ වාසස්ථානයට ආසන්නවම **පොදු ස්ථාන වලට** සපයනු ලබන අනුමත බඳුන් වලට හෝ බහාලුම් වලට දැමිය යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය. (මෙහි උපලේඛනය 7 සඳහන් වන අපද්‍රව්‍ය )

(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය.

(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය, ( එනම් විද්‍යුත් අපද්‍රව්‍යය සනීපාරක්ෂක අපද්‍රව්‍යය සායනික අපද්‍රව්‍යය ඉවතලන ඖෂධ වැනි මෙහි උපලේඛනය 6 සඳහන් වන අපද්‍රව්‍යය )

(ඈ) සතුන්ගේ මළකුණු, ශරීර කොටස් සහ අසූචි,

(iii) ඉහත කාන්ඩ වලට අයත් නොවන අපද්‍රව්‍යයක් ජනිත වූයේනම් ඒ පිලිබඳව අදාල ජනිත කරන්නා විසින් ගාල්ල මහ නගරසභාව වෙතින් ලිඛිත උපදෙස් ලබාගෙන ගාල්ල මහ නගරසභාව විසින් නගරසභාව ලබාදෙන ලිඛිත උපදෙස් වලට අනුකූලව කටයුතු කලයුතුය.

(iv) මේ අතුරු ව්‍යවස්ථාවේ (ii) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ඉවත් කිරීම පිණිස ලියා පදිංචි අපද්‍රව්‍ය එක් රැස් කරන්නකුට අවසර දීමට කොමසාරිස් වරයාට හෝ වරියට බලය ඇත්තේ ය .

## සාප්පු සහ කාර්යාල

11. (i) ගාල්ල මහා නගරසභා සීමාව තුල පිහිටි සාප්පුවක හෝ කාර්යාලයක සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම එක් එක් සාප්පුවේ, කාර්යාලයේ හෝ කාර්යාල / සාප්පු සංකීර්ණයේ එකතුවන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) (අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය. (මෙහි උපලේඛනය 7 සඳහන් වන ද්‍රව්‍ය )

(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය.

(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය, ( එනම් විද්‍යුත් අපද්‍රව්‍යය සනීපාරක්ෂක අපද්‍රව්‍යය සායනික අපද්‍රව්‍යය ඉවතලන ඖෂධ වැනි මෙහි 6 වන උපලේඛනයේ දැක්වෙන අපද්‍රව්‍යය )

(ඈ) සතුන්ගේ මළකුණු, ශරීර කොටස් සහ අසූචි,

(ii) ඉහත කාන්ඩ වලට අයත් නොවන අපද්‍රව්‍යයක් ජනිත වූයේනම් ඒ පිලිබඳව අදාල ජනිත කරන්නා විසින් ගාල්ල මහා නගරසභාව වෙතින් ලිඛිත උපදෙස් ලබාගෙන ගාල්ල මහා නගරසභාව විසින්ලබාදෙන ලිඛිත උපදෙස් වලට අනුකූලව කටයුතු කලයුතුය.

(iii) කසල ජනනය වීම අවම කිරීමට සහ ඉහත පරිදි වෙන්කරන ලද කසල එකතුකිරීම තාවකාලිකව ගබඩාකිරීම සහ බැහැර කිරීම පිලිබඳව පසුවිපරම් කිරීම මෙන්ම ජනනය වන කසල ප්‍රමාණය පිලිබඳව දත්ත හා තොරතුරු මාසිකව ගාල්ල මහා නගරසභාව වෙත ලබාදීමට බැඳී සිටින අතර එවැනි කසල කලමනාකරන සැලසුමකට අදාල සාප්පුවක හෝ කාර්යාලයක සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම ගාල්ල මහා නගරසභාව සමග එලඹිය යුතු වන්නේය.

(iv) අදාල සාප්පුවක හෝ කාර්යාල විසින් අදාල සාප්පුවක හෝ කාර්යාලයේ කසල කලමණාකරණය පිලිබඳ වගකීම දරන නිලධාරියෙක් / නිලධාරිනියක් නම් කර ගාල්ල මහා නගරසභාවේ කසල කලමනාකරන ඒකකය සමග සම්බන්ධ කිරීම සහ අදාල නිලධාරියාට නිලධාරිනියට අවශ්‍යය පහසුකම් ලබා දීම අදාල සාප්පුවක හෝ කාර්යාලයේ ප්‍රධානියාගේ වගකීම වන්නේය.

(v) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය ඉවත් කරනු ලබන තුරු වෙන් වෙන් වශයෙන් බඳුන් වලට හෝ බහාලුම්වලට දමා සුදුසු ස්ථානයක ගබඩා කරනු ලැබිය යුත්තේ ය.

(vi) සාප්පුවක හෝ කාර්යාලයක හිමිකරුට හෝ පදිංචිකරුට මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති

අපද්‍රව්‍ය වර්ග ගාල්ල මහා නගරසභාවේ බලයලත් අපද්‍රව්‍ය එක් රැස් කරන්නකුට භාරදිය හැකි ය.

(vii) තනි මහල් හෝ හල් කිහිපයකින් යුක්ත සාප්පු හෝ කාර්යාල සංකීර්ණයක හිමිකරු හෝ පදිංචිකරු කොමසාරිස් වරයා විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට අනුකූලව එම සාප්පුවෙන් හෝ කාර්යාලයෙන් තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය එක් රැස් කිරීම හෝ තැන්පත් කිරීම සඳහා එක් එක් සාප්පුව හෝ කාර්යාලය සඳහා අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් අවශ්‍ය සංඛ්‍යාව සැපයිය යුත්තේ ය.

(viii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (v) වැනි උපවගන්තියේ විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති සාප්පුවක හෝ කාර්යාලයක යම් හිමිකරුවෙක් තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙන වෙනම බඳුන් වලට හෝ බහාලුම්වලට දැමිය යුත්තේ ය. මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග ගාල්ල මහා නගරසභාවේ බලයලත් අපද්‍රව්‍ය එක් රැස් කරන්නකුට භාරදීමට සෑම හිමිකරුවකුට සහ පදිංචිකරුවකුට හැකියාව ඇත.

(ix) ගාල්ල මහා නගරසභාවේ ලියාපදිංචි නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නකු විසින් එක් රැස් නොකරන ලද මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග සහ (ii) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග ගාල්ල මහා නගරසභාවේ විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් කොමසාරිස් වරයාට ගෙවීම මත අදාල වන පරිදි හිමිකරු හෝ පදිංචිකරු විසින් ගාල්ල මහා නගර සභාවට භාර දිය යුත්තේ ය. එසේ නැතිනම් ගාල්ල මහා නගර සභාවේ ලියාපදිංචි නාගරික අපද්‍රව්‍යය එක් රැස් කරන්නෙකුට ලබා දිය හැකිය.

(x) අසල්වාසීන්ට හෝ එකී සාප්පුවේ හෝ කාර්යාලයේ සේවයේ නියුතු තැනැත්තන්ට හෝ යම් සෞඛ්‍ය හෝ සනීපාරක්ෂක ගැටළුවක් ඇති නොවීම පිණිස අපද්‍රව්‍ය ඉවත් කිරීමත් මෙම අතුරු ව්‍යවස්ථාවේ විශේෂයෙන් නියම කර ඇති අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම නඩත්තු කිරීමත් යම් සාප්පුවක හෝ කාර්යාලයක සෑම හිමිකරුවකුගේම වගකීම වන්නේ ය.

## හෝටල්

12. (i) ගාල්ල මහ නගරසභා සීමාව තුල යම් හෝටල්කරුවෙක් හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් තම පරිශ්‍රයේ එක් රැස්වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය. නැතහොත් එසේ කිරීමට සැලැස්විය යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය. (මෙහි උපලේඛනය 7 සඳහන් වන අපද්‍රව්‍ය )

(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය.

(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය, ( එනම් විද්‍යුත් අපද්‍රව්‍යය සනීපාරක්ෂක අපද්‍රව්‍යය සායනික අපද්‍රව්‍යය ඉවතලන ඖෂධ වැනි මෙහි උපලේඛනය 6 සඳහන් වන අපද්‍රව්‍යය )

(ඈ) සතුන්ගේ මළකුණු, ශරීර කොටස් සහ අසූචි,

(ii) ඉහත කාන්ඩ වලට අයත් නොවන අපද්‍රව්‍යයක් ජනිත වූයේනම් ඒ පිලිබඳව අදාල ජනිත කරන්නා විසින් ගාල්ල මහ නගරසභාව වෙතින් ලිඛිත උපදෙස් ලබාගෙන ගාල්ල මහ නගරසභාව විසින් නගරසභාව ලබාදෙන ලිඛිත උපදෙස් වලට අනුකූලව කටයුතු කලයුතුය.

(iii) කසල ජනනය වීම අවම කිරීමට සහ ඉහත පරිදි වෙන්කරන ලද කසල එකතුකිරීම තාවකාලිකව ගබඩාකිරීම සහ බැහැර කිරීම පිලිබඳව පසුවිපරම් කිරීම මෙන්ම ජනනය වන කසල ප්‍රමානය පිලිබඳව දත්ත හා තොරතුරු මාසිකව ගාල්ල මහා නගරසභාව වෙත ලබාදීම වැනි කසල කලමනාකරන සැලසුමකට අදාල හෝටල් කරුවෙකුම මහනගර සභාව සමග එලඹිය යුතු වන්නේය.

(iv) අදාල හෝටල්කරු විසින් අදාල ආයතනයේ කසල කලමණාකරණය පිලිබඳ වගකීම දරන සේවකයෙක් / සේවිකාවක් නම් කර ගාල්ල මහා නගරසභාව සභාවේ කසල කලමනාකරන ඒකකය සමග සම්බන්ධ කිරීම සහ අදාල සේවකයෙක් / සේවිකාවක ට අවශ්‍යය පහසුකම් ලබා දීම අදාල හෝටල් කරුගේ වගකීම වන්නේය.

(v) සෑම හෝටල් කරුවෙක්ම හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය ඉවත් කරනු ලබන තෙක් වෙන් වෙන් වශයෙන් යෝග්‍ය බදුන් වලට හෝ බහාලුම් වලට දමා සුදුසු ස්ථානයක ගබඩා කළ යුත්තේ ය.

(vi) සැම හෝටල් කරුවෙක් හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් මැස්සන්, මීයන්, කෘමීන් හෝ යම් වෙනත් සතෙකු ඇතුළුවීම වළකමින් සියලුම ආහාර අපද්‍රව්‍ය සහ ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය ප්ලාස්ටික් හෝ ලෝහ ද්‍රව්‍යයකින් සාදන ලද සහ පියනක් යොදා නිසි ලෙස ආරක්ෂාකාරී කරන ලද බදුනක් හෝ වෙනත් බහාලුමක ඇසිරිය යුත්තේ ය.

(vii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ගාල්ල මහ නගරසභාවේ ලියාපදිංචි අපද්‍රව්‍ය එක් රැස් කරන්නකුට භාරදිය හැකිය.

(viii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (v) වැනි උපවගන්තිය යටතේ භාරදෙනු නොලැබූ එවැනි යම් අපද්‍රව්‍යයක් සහ (i) වැනි උපවගන්තියේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග, අපද්‍රව්‍යවල ස්වභාවය සැලකිල්ලට ගෙන සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් හිමිකරු හෝ පදිංචිකරු විසින් කොමසාරිස් වරයාට

ගෙවීම මත ගාල්ල මහා නගරසභාවේ ලියාපදිංචි නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නකුට භාරදිය යුත්තේ ය.

## එළවළු සහ පළතුරු වෙළඳසැල්

13. (i) සෑම එළවළු හෝ පළතුරු වෙළඳ සැලකම හිමිකරු හෝ එය භාරව සිටින තැනැත්තා පරිශ්‍රයේ එක් රැස්වන අපද්‍රව්‍ය සහ දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය. (මෙහි උපලේඛනය 7 සඳහන් වන අපද්‍රව්‍ය )

(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය.

(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය, ( එනම් විද්‍යුත් අපද්‍රව්‍යය සනීපාරක්ෂක අපද්‍රව්‍යය සායනික අපද්‍රව්‍යය ඉවතලන ඖෂධ වැනි මෙහි උපලේඛනය 6 සඳහන් වන අපද්‍රව්‍යය )

(ඈ) සතුන්ගේ මළකුණු, ශරීර කොටස් සහ අසූචි,

(ii) ඉහත කාන්ඩ වලට අයත් නොවන අපද්‍රව්‍යයක් ජනිත වූයේනම් ඒ පිලිබඳව අදාල ජනිත කරන්නා විසින් ගාල්ල මහ නගරසභාව වෙතින් ලිඛිත උපදෙස් ලබාගෙන ගාල්ල මහ නගරසභාව විසින් නගරසභාව ලබාදෙන ලිඛිත උපදෙස් වලට අනුකූලව කටයුතු කලයුතුය.

(iii) කසල ජනනය වීම අවම කිරීමට සහ ඉහත පරිදි වෙන්කරන ලද කසල එකතුකිරීම තාවකාලිකව ගබඩාකිරීම සහ බැහැර කිරීම පිලිබඳව පසුවිපරම් කිරීම මෙන්ම ජනනය වන කසල ප්‍රමානය පිලිබඳව දත්ත හා තොරතුරු මාසිකව ගාල්ල මහා නගරසභාව වෙත ලබාදීම වැනි කසල කලමනාකරන සැලසුමකට අදාල සෑම එළවළු හෝ පළතුරු වෙළඳ සැලකම හිමිකරුවෙකුම ගාල්ල මහා නගරසභාව සමග එළඹිය යුතු වන්නේය.

(iv) අදාල සෑම එළවළු හෝ පළතුරු වෙළඳ සැලකම හිමිකරුවෙකුම විසින් අදාල වෙලඳසැලේ කසල කලමණාකරණය පිලිබඳ වගකීම දරන සේවකයෙක් / සේවිකාවක් නම් කර ගාල්ල මහා නගරසභාවේ කසල කලමනාකරන ඒකකය සමග සම්බන්ධ කිරීම සහ අදාල සේවකයෙක් / සේවිකාවක ට අවශ්‍යය පහසුකම් ලබා දීම අදාල සෑම එළවළු හෝ පළතුරු වෙළඳ සැලකම හිමිකරුවෙකුගේම වගකීම වන්නේය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) අයිතමයෙහි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග තෙතමනය කාන්දු නොවන ප්ලාස්ටික් හෝ ලෝහ ද්‍රව්‍යයකින් සාදන ලද වෙනම බහාලුමක තැබිය යුතු අතර, එය තුළට මැස්සන්, මීයන්, කෘමීන් හෝ යම් වෙනත් සතුන් ඇතුළුවීම වළකමින් නිසි ලෙස සුරක්ෂිත කර තැබිය යුත්තේ ය. අනෙකුත් අපද්‍රව්‍ය සුදුසු යම් බඳුනකට හෝ වෙනත් බහාලුමකට හෝ දැමිය යුත්තේ ය.

(vi) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ), (ආ) සහ (ඇ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ගාල්ල මහා නගරසභාවේ බලයලත් අපද්‍රව්‍ය එක් රැස් කරන්නකුට භාරදිය හැකිය. එසේ භාරදෙනු නොලැබූ යම් අපද්‍රව්‍යයක් මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (ඈ) අයිතමයේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ද සමග ගාල්ල මහා නගරසභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් කොමසාරිස් වරයාට ගෙවීම මත ගාල්ල මහා නගරසභාවේ ලියාපදිංචි නාගරික අපද්‍රව්‍යය එක්රැස් කරන්නකුට භාරදිය යුත්තේ ය.

## ඝෝඝාතකාගාර,මස්,මාළු,කුකුළුමස් සහ බිත්තර වෙලඳ කුටි.

14. (i) තත් කර්යය සඳහා ගාල්ල මහා නගර සභාවේ නගරාධිපති වරයා විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ පුද්ගලයෙක් විසින් නිකුත් කරනු ලැබූ බලපත්‍රයක් ප්‍රකාර එහි සඳහන් ස්ථානයේදී කිසිම තැනැත්තෙක් ඝෝගාතක ආඥාපනතේ විධිවිධාන යටතේ අවසරලත් සතුන් හෝ පක්ෂීන් හැරුණු විට වෙනත් කිසිම සතෙකු හෝ පක්ෂියෙකු ඝාතනය නොකළ යුත්තේ ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයකම ඝාතනය කරනු ලැබිය හැකි සතාගේ හෝ පක්ෂියාගේ වර්ගය, ඝාතකාගාරය ඉදිකරනු ලැබිය යුතු ආකාරය, පිරිසිදු කිරීමට හා මිනිස් පරිභෝජනයට නොගන්නා ලේ, අතුණු බහන් හා වෙනත් කොටස් ඉවත් කිරීමට අදාළ කොන්දේසි සහ ගාල්ල මහා නගර සභාව යෝග්‍ය යයි කල්පනා කරන වෙනත් කොන්දේසි විශේෂයෙන් සඳහන් කළ යුත්තේ ය.

(iii) මෙම අතුරු ව්‍යවස්ථාවේ 14 (i) වැනි උපවගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා කලින් කලට සභාව විසින් තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ගාල්ල මහා නගර සභාවේ කොමසාරිස් වරයා විසින් අයකරනු ඇති අතර, එම ගාස්තුව බලපත්‍රය නිකුත් කරනු ලබන අවස්ථාවේදී ගෙවිය යුතු වේ.

(iv) මස්, කුකුල් මස්, මාළු හෝ බිත්තර අලෙවි කිරීම සඳහා ඇති කුටියක හිමිකරු හෝ එම ව්‍යපාරය කරගෙන යන අය හෝ ඔවුන්ගේ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය. (මෙහි උපලේඛනය 7 සඳහන් වන අපද්‍රව්‍ය )

(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය.

(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය, ( එනම් විද්‍යුත් අපද්‍රව්‍යය සනීපාරක්ෂක අපද්‍රව්‍යය සායනික අපද්‍රව්‍යය ඉවතලන ඖෂධ වැනි මෙහි උපලේඛනය 6 සඳහන් වන අපද්‍රව්‍යය )

(ඈ) සතුන්ගේ මළකුණු, ශරීර කොටස් සහ අසූචි,

(v) ඉහත කාන්ඩ වලට අයත් නොවන අපද්‍රව්‍යයක් ජනිත වූයේනම් ඒ පිලිබඳව අදාල ජනිත කරන්නා විසින් ගාල්ල මහා නගරසභාව වෙතින් ලිඛිත උපදෙස් ලබාගෙන ගාල්ල මහා නගරසභාව විසින් නගරසභාව ලබාදෙන ලිඛිත උපදෙස් වලට අනුකූලව කටයුතු කලයුතුය.

(vi) කසල ජනනය වීම අවම කිරීමට සහ ඉහත පරිදි වෙන්කරන ලද කසල එකතුකිරීම තාවකාලිකව ගබඩාකිරීම සහ බැහැර කිරීම පිලිබඳව පසුවිපරම් කිරීම මෙන්ම ජනනය වන කසල ප්‍රමානය පිලිබඳව දත්ත හා තොරතුරු මාසිකව ගාල්ල මහා නගරසභාව වෙත ලබාදීම වැනි, කසල වලට අදාලව සෑම මස්, කුකුල් මස්, මාළු හෝ බිත්තර අලෙවි කිරීම සඳහා ඇති කුටියක හිමිකරු හෝ එම ව්‍යපාරය කරගෙන යන අය ගාල්ල මහා නගරසභාව සමග කසල කලමනාකරන සැලසුමකට එලඹිය යුතු වන්නේය.

(vii) මස්, කුකුල් මස්, මාළු හෝ බිත්තර අලෙවි කිරීම සඳහා ඇති කුටියක හිමිකරු හෝ එම ව්‍යපාරය කරගෙන යන අය විසින් අදාල වෙලඳසැලේ කසල කලමණාකරණය පිලිබඳ වගකීම දරන සේවකයෙක් / සේවිකාවක් නම් කර ගාල්ල මහා නගර සභාවේ කසල කලමනාකරන ඒකකය සමග සම්බන්ධ කිරීම සහ අදාල සේවකයෙක් / සේවිකාවක ට අවශ්‍යය පහසුකම් ලබා දීම අදාල මස්, කුකුල් මස්, මාළු හෝ බිත්තර අලෙවි කිරීම සඳහා ඇති කුටියක හිමිකරු හෝ එම ව්‍යපාරය කරගෙන යන අයගේ වගකීම වන්නේය.

(viii) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙනම භාජනයක හෝ වෙනත් බහාලුමක තැබිය යුත්තේ ය. මෙම අතුරු ව්‍යස්ථාවේ (iv) වැනි උපවගන්තියේ (අ) අයිතමයේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග තෙතමනය කාන්දු නොවන බහාලුමක් ඇතුළත තැබිය යුතු අතර එම බහාලුමට මැස්සන්, මීයන්, කෘමීන් හෝ වෙනත් සතුන් ඇතුළුවීම වළකමින් එය නිසි ලෙස සුරක්ෂිත කර තැබිය යුත්තේ ය.

(ix) මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වැනි උපවගන්තියේ (අ) (ආ) සහ (ඇ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ගාල්ල මහා නගර සභාවේ ලියාපදිංචි අපද්‍රව්‍ය එක් රැස් කරන්නෙකුට භාරදිය හැකිය. එසේ භාරදෙනු නොලැබූ යම් අපද්‍රව්‍යයක් මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වැනි උපවගන්තියේ (ඈ) අයිතමයේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ගය ද සමග සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ගෙවීම මත දුර්ගන්ධය පැතිරයාමට පෙර ලියාපදිංචි නාගරික අපද්‍රව්‍ය එක් රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

## ජංගම හා පදික වෙළඳාම

15. (i) ගාල්ල මහා නගර සභාව විසින් විශේෂිත උත්සව හා වෙනත් අවස්ථාවන් වලදී අවසර දෙනු ලබන අපද්‍රව්‍ය ජනනය වන්නාවූ ව්‍යාපාරයක් කරගෙන යන ජංගම හා පදික වෙලෙන්ඳන් සඳහා ගාල්ල මහා නගර සභාවේ කොමසාරිස් වරයා විසින් අනුමත කරනු ලබන ප්‍රමිතීන්ට අනුකූලව එම අපද්‍රව්‍ය දැමීම සඳහා බඳුනක් හෝ බහාලුමක් තබාගත යුත්තේ ය. එවැනි කිසිම අපද්‍රව්‍යයක් පදික වේදිකාවේ. මාහාමාර්ගයේ හෝ පොදු ස්ථානයක නොදැමිය යුත්තේ ය.

(ii) ඉහත දැක්වෙන පදික වෙළෙන්දෙක් වාහන වල හෝ පදිකයින්ගේ ගමනාගමනයට බාධා ඇති වන ආකාරයෙන් බඳුනක් හෝ වෙනත් බහාලුමක් නොතැබිය යුත්තේ ය.

(iii) සෑම ජංගම සහ පදික වෙළෙන්දෙක්ම ඔහු ගේ ව්‍යාපාරය හේතුවෙන් ජනය වන්නා වූ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය. (මෙහි උපලේඛනය 7 සඳහන් වන අපද්‍රව්‍ය )

(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය.

(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය, ( එනම් විද්‍යුත් අපද්‍රව්‍යය සනීපාරක්ෂක අපද්‍රව්‍යය සායනික අපද්‍රව්‍යය ඉවතලන ඖෂධ වැනි මෙහි උපලේඛනය 6 සඳහන් වන අපද්‍රව්‍යය )

(ඈ) සතුන්ගේ මළකුණු, ශරීර කොටස් සහ අසූචි,

(iv) ඉහත කාන්ඩ වලට අයත් නොවන අපද්‍රව්‍යයක් ජනිත වූයේනම් ඒ පිලිබඳව අදාල ජනිත කරන්නා විසින් ගාල්ල මහා නගරසභාව වෙතින් ලිඛිත උපදෙස් ලබාගෙන ගාල්ල මහා නගරසභාව විසින් ලබාදෙන ලිඛිත උපදෙස් වලට අනුකූලව කටයුතු කලයුතුය.

(v) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙනම බඳුනක් හෝ වෙනත් බහාලුමක් තුළට දැමිය යුත්තේ ය. මෙම අතුරු ව්‍යවස්ථාවේ (iii) වැනි උපවගන්තියේ (අ) අයිතමයේ විශේෂයෙන් සඳහන් කර ඇත්තා වූ කෘමීන්, මීයන් හෝ සතුන් විසින් කා දමනු ලැබිය හැක්කා වූ අපද්‍රව්‍ය ආරක්ෂාකාරී බහාලුමක අභ්‍යන්තරයේ තැබිය යුතු අතර අමතර අපද්‍රව්‍ය දැමීමට අවශ්‍ය වන විට හැර එය වසා තැබිය යුත්තේ ය.

(vi) සෑම පදික වෙළෙන්දෙක්ම මෙම අතුරු ව්‍යස්ථාවේ (iii) වැනි උපවගන්තියේ (අ) හා (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ගාල්ල මහා නගර සභාවේ ලියාපදිංචි අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට හෝ මෙම අතුරු ව්‍යවස්ථාවේ (iii) වැනි උපවගන්තියේ (ඇ) අයිතමයේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ද සමග ගාල්ල මහා නගර සභාවේ ලියාපදිංචි නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට දෛනිකව භාරදිය යුත්තේ ය. ව්‍යාපාරය පවත්වාගෙන යනු නොලබන අවස්ථාවේ අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් පදික වේදිකාවක පාර අයිනේ හෝ මහා මාර්ගයේ නොතැබිය යුත්තේ ය. එසේ නොවන්නේනම් ව්‍යාපාර කටයුතු අවසානයේ දෛනිකව නිසිපරිදි ගාල්ල මහා නගරසභාව විසින් නිර්දේශ කරනු ලබන ආකාරයට නිසි ස්ථානයකට අපද්‍රව්‍යය බැහැර කිරීම සිදුකල යුතුය.

(vii) සෑම පදික වෙළෙන්දෙක්ම අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම ගාල්ල මහ නගර සභාවේ ලියා පදිංචි නාගරික අපද්‍රව්‍ය එක් රැස් කරන්නෙකුට භාරදීමට පෙර සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ගෙවිය යුත්තේ ය.

## කර්මාන්ත ශාලා

16. (i) ගාල්ල මහා නගර සභාවේ සීමාව තුල සෑම කර්මාන්තශාලා හිමිකරුවෙක්ම හෝ නිෂ්පාදකයෙක්ම කර්මාන්තශාලා පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ අපද්‍රව්‍ය එක්කාසු කර පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය. (මෙහි උපලේඛනය 7 සඳහන් වන අපද්‍රව්‍ය )

(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය.

(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය, ( එනම් විද්‍යුත් අපද්‍රව්‍යය සනීපාරක්ෂක අපද්‍රව්‍යය සායනික අපද්‍රව්‍යය ඉවතලන ඖෂධ වැනි මෙහි උපලේඛනය 6 සඳහන් වන අපද්‍රව්‍යය )

(ඈ) සතුන්ගේ මළකුණු, ශරීර කොටස් සහ අසූචි,

(ii) ඉහත කාන්ඩ වලට අයත් නොවන අපද්‍රව්‍යයක් ජනිත වූයේනම් ඒ පිලිබඳව අදාල ජනිත කරන්නා විසින් ගාල්ල මහා නගරසභාව වෙතින් ලිඛිත උපදෙස් ලබාගෙන ගාල්ල මහා නගරසභාව විසින් නගරසභාව ලබාදෙන ලිඛිත උපදෙස් වලට අනුකූලව කටයුතු කලයුතුය.

(iii) කසල ජනනය වීම අවම කිරීමට සහ ඉහත පරිදි වෙන්කරන ලද කසල එකතුකිරීම තාවකාලිකව ගබඩාකිරීම සහ බැහැර කිරීම පිලිබඳව පසුවිපරම් කිරීම මෙන්ම ජනනය වන කසල ප්‍රමානය පිලිබඳව දත්ත හා තොරතුරු මාසිකව ගාල්ල මහා නගර සභාව වෙත ලබාදීම වැනි කසල කලමනාකරන සැලසුමකට අදාල සෑම කර්මාන්තශාලා හිමිකරුවෙක්ම හෝ නිෂ්පාදකයෙක්ම ගාල්ල මහා නගර සභාව සමග එලඹිය යුතු වන්නේය.

(iv) සෑම කර්මාන්තශාලා හිමිකරුවෙක්ම හෝ නිෂ්පාදකයෙක්ම විසින් අදාල කර්මාන්ත ශාලාවේ කසල කලමණාකරණය පිලිබඳ වගකීම දරන සේවකයෙක් / සේවිකාවක් නම් කර ගාල්ල මහා නගර සභාවේ කසල කලමනාකරන ඒකකය සමග සම්බන්ධ කිරීම සහ අදාල සේවකයෙක් / සේවිකාවක ට අවශ්‍යය පහසුකම් ලබා දීම අදාල සෑම කර්මාන්තශාලා හිමිකරුවෙක්ම හෝ නිෂ්පාදකයෙක්ම වගකීම වන්නේය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ගාල්ල මහා නගරසභාවේ ලියාපදිංචි අපද්‍රව්‍ය එක් රැස් කරන්නෙකුට භාරදිය හැකිය. එසේ භාරදෙනු නොලැබූ යම් අපද්‍රව්‍යයක් ගාල්ල මහා නගරසභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් කොමසාරිස් වරයාට ගෙවීම මත ගාල්ල මහා නගරසභාවේ බලය ලත් නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

(vi) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ එම ව්‍යාපාරය සඳහා නිකුත් කරනු ලබන පරිසර ආරක්ෂණ බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව උපද්‍රවකාරී අපද්‍රව්‍ය ඉවත් කළ යුතු වන්නේ ය.

## කැනීම, ඉදිකිරීම සහ කඩා දැමීම

17. (i) ගාල්ල මහ නගරසභාවේ සීමාව තුල යම් විථියක්, පාරක් හෝ පොදු ස්ථානයක් කනින හෝ පෞද්ගලික දේපලක් කනින නිර්මාණයක් ඉදිකරන හෝ කඩාදමන සෑම තැනැත්තෙක්ම එමගින් ජනනය වන්නා වූ අපද්‍රව්‍ය ගාල්ල මහා නගර සභාව විසින් නිර්දේශ කරනු ලබන සුදුසු ආකාරයකින් එකී පරිශ්‍රයෙන් ඉවත් කල යුතුය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ සඳහන් වන අපද්‍රව්‍ය ගාල්ල මහා නගර සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි භාස්තුවක් ගාල්ල මහා නගරසභාවේ කොමසාරිස් වරයාට ගෙවීම මත ගාල්ල මහා නගර සභාවේ ඉදිකිරීම් අපද්‍රව්‍යය කලමණාකරන මධ්‍යස්ථානයට (කොවෑම් මධ්‍යස්ථානයට)හෝ ගාල්ල මහා නගරසභාවේ ලියාපදිංචි නාගරික අපද්‍රව්‍ය එක් රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

18. (i) ගෑස්, විදුලිය, ජලය දුරකථන පහසුකම් හෝ වෙනත් පොදු පහසුකම් සැපයීම සඳහා යම් විථියක්, පාරක් හෝ පොදු ස්ථානයක් කැනීම නිසා යම් ඉදිකිරීමක් හෝ බිඳහෙලීමේ ක්‍රියාවලියක් හෝ පුද්ගලික පරිශ්‍රයක කැනීමක් නිසා යම් ඉදිකිරීමක් හෝ බිඳහෙලීමේ ක්‍රියාවලියක් ජනනය වන්නා වූ අපද්‍රව්‍යය කලමණාකරනය සම්බන්ධව යම් තැනැත්තෙක් ගාල්ල මහා නගරසභාවේ කොමසාරිස් වරයාගෙන් ලිඛිතව පූර්ව අනුමැතිය ලබාගත යුත්තේ ය.

(ii) ඉහත (i) වැනි උපවගන්තිය යටතේ අනුමැතිය දීමට පෙර ගාල්ල මහා නගරසභාවේ කොමසාරිස් වරයා විසින් **උපලේඛනය 8** පරිදි සකස් කරන ලද ආකෘථියකට අනුව අදාල කාර්යාවලිය තුලදී ජනනය වියහැකි කසල වර්ග ( ප්‍රතිභාවිතාකරනීය ප්‍රතිචක්‍රීකරනීය උපද්‍රවකාරී ( විද්‍යුත් සනීපාරක්ෂක ද්‍රව්‍යය සහ ඉවතලන ඖෂධ වැනි ) ඉහත කාන්ඩ වලට අයත් නොවන වෙනත් අවද්‍රව්‍යය ජනනය වන ප්‍රමානය පිලිබඳව අපද්‍රව්‍යය අවම කිරීමට ගනු ලබන පියවර සහ අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා ඉල්ලුම්කරු විසින් යොදා ඇති වැඩපිළිවෙල, යෝජිත කාර්යය නිමවීමෙන් පසු පාරේ හෝ පොදු ස්ථානයක තාවකාලිකව තැබීමට සිදුවිය හැකි අපද්‍රව්‍ය ප්‍රමාණය සහ ඉල්ලුම්කරු එකී අපද්‍රව්‍ය ඉවත් කිරීම අතපසු කරයි නම් එය ඉවත් කිරීමට අවශ්‍ය වන පිරිවැය ද සැලකිල්ලට ගත යුත්තේ ය. අනුමැතිය ලබාදීමට පෙර ඉල්ලුම්කරු ඇස්තමේන්තුගත පිරිවැයට සමාන වූ මුදලක් තැන්පතුවක් වශයෙන් ගෙවීම අවශ්‍ය වන්නේ ය.

(iii) යම් තැනැත්තෙකු අපද්‍රව්‍ය මුළු ප්‍රමාණයම හෝ එයින් කොටසක් හෝ ඉවත් කිරීමට අපොහොසත් වේ නම් හෝ ඉවත් කිරීම අතපසු කරයි නම් ගාල්ල මහ නගර සභාවේ කොමසාරිස් වරයා විසින් තීරණය කරනු ලබන ආකාරයට එකී අපද්‍රව්‍ය ප්‍රමාණය ඉවත් කරනු ලැබිය යුතු අතර එහි ප්‍රතිඵලයක් ලෙස දැරීමට සිදුවන වියදම (ii) වැනි උපවගන්තිය යටතේ තැන්පත් කරනු ලබන මුදල් වලට හිලව් කරනු ලැබේ. නැතහොත් ඉල්ලුම් කරු විසින් අවසර ලබා ගැනීමේදී ඉදිරිපත් කරන ලද ආකෘථියක සඳහන් කාල

සීමාව ඉක්මවා ගොස් සති හයක් ඇතුලත අපද්‍රව්‍යය මුලු ප්‍රමානයම ඉවත් කිරීම සම්පූර්න නොකරන්නේ නම් තැන්පත් කරන ලද මුදල ඒ සඳහා හිලව් කරනු ලැබේ.

## ආරෝග්‍ය ශාලා

19. (i) ආරෝග්‍යශාලාවක, හිමිකරු පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය. (මෙහි උපලේඛනය 7 සඳහන් වන අපද්‍රව්‍ය )

(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය.

(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය, ( එනම් විද්‍යුත් අපද්‍රව්‍යය සනීපාරක්ෂක අපද්‍රව්‍යය සායනික අපද්‍රව්‍යය ඉවතලන ඖෂධ වැනි මෙහි උපලේඛනය 6 සඳහන් වන අපද්‍රව්‍යය )

(ඈ) සතුන්ගේ මළකුණු, ශරීර කොටස් සහ අසූචි,

(ii) ඉහත කාන්ඩ වලට අයත් නොවන අපද්‍රව්‍යයක් ජනිත වූයේනම් ඒ පිලිබඳව අදාල ජනිත කරන්නා විසින් ගාල්ල මහ නගරසභාව වෙතින් ලිඛිත උපදෙස් ලබාගෙන ගාල්ල මහා නගරසභාව විසින් නගරසභාව ලබාදෙන ලිඛිත උපදෙස් වලට අනුකූලව කටයුතු කලයුතුය.

(iii) කසල ජනනය වීම අවම කිරීමට සහ ඉහත පරිදි වෙන්කරන ලද කසල එකතුකිරීම තාවකාලිකව ගබඩාකිරීම සහ බැහැර කිරීම පිලිබඳව පසුවිපරම් කිරීම මෙන්ම ජනනය වන කසල ප්‍රමානය පිලිබඳව දත්ත ගාල්ල මහා නගර සභාව වෙත ලබාදීම වැනි කසල කලමනාකරන සැලසුමකට අදාල සෑම ආරෝග්‍යශාලාවක, හිමිකරුවෙකුම ගාල්ල මහා නගර සභාව සමග එලඹිය යුතු වන්නේය.

(iv) සෑම ආරෝග්‍යශාලාවක, හිමිකරුවකුම විසින් අදාල ආරෝග්‍යශාලාවේ කසල කලමණාකරණය පිලිබඳ වගකීම දරන සේවකයෙක් / සේවිකාවක් නම් කර ගාල්ල මහා නගර සභාවේ කසල කලමනාකරන ඒකකය සමග සම්බන්ධ කිරීම සහ අදාල සේවකයෙක් / සේවිකාවක ට අවශ්‍යය පහසුකම් ලබා දීම අදාල සෑම ආරෝග්‍යශාලාවක, හිමිකරුවකුගේම වගකීම වන්නේය.

(v) (i) වැනි උපවගන්තිය යටතේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග වෙනම බහාලුම් වල තැන්පත් කර ඒවා ඉවත් කරනු ලබන තෙක් යෝග්‍ය ස්ථානයක ගබඩා කළ යුත්තේ ය. (i) වැනි උපවගන්ති යටතේ (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ඒ සඳහාම විශේෂයෙන් සාදන ලද බඳුනක හෝ බහාලුමක තැන්පත් කළ යුතු අතර ඒ සඳහා වෙන් කරනු ලැබූ ස්ථානයක තැබිය යුත්තේ ය. 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ එම ආරෝග්‍යශාලාවලට නිකුත් කරනු ලැබූ අදාල බලපත්‍ර වල දක්වා ඇති කොන්දේසි වලට අනුකූලව එම අපද්‍රව්‍ය ඉවත් කළ යුත්තේ ය.

(vi) (i) වැනි උපවගන්තියේ (අ) හා (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක් රැස් කරන්නෙකුට හෝ සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ගෙවීම මත ලියා පදිංචි නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

## මල් ශාලා අවමංගල්‍යය ශාලා

20.

(i) මල් ශාලාවක අවමංගල්‍යය ශාලාවක, හිමිකරු පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය. (මෙහි **උපලේඛනය 7** සඳහන් වන අපද්‍රව්‍ය )

(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය.

(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය, ( එනම් විද්‍යුත් අපද්‍රව්‍යය සනීපාරක්ෂක අපද්‍රව්‍යය සායනික අපද්‍රව්‍යය ඉවතලන ඖෂධ වැනි මෙහි **උපලේඛනය 6** සඳහන් වන අපද්‍රව්‍යය )

(ඈ) සතුන්ගේ මළකුණු, ශරීර කොටස් සහ අසූචි,

(ii) ඉහත කාන්ඩ වලට අයත් නොවන අපද්‍රව්‍යයක් ජනිත වූයේනම් ඒ පිලිබඳව අදාල ජනිත කරන්නා විසින් ගාල්ල මහා නගරසභාව වෙතින් ලිඛිත උපදෙස් ලබාගෙන ගාල්ල මහා නගරසභාව විසින් නගරසභාව ලබාදෙන ලිඛිත උපදෙස් වලට අනුකූලව කටයුතු කලයුතුය.

(iii) කසල ජනනය වීම අවම කිරීමට සහ ඉහත පරිදි වෙන්කරන ලද කසල එකතුකිරීම තාවකාලිකව ගබඩාකිරීම සහ බැහැර කිරීම පිලිබඳව පසුවිපරම් කිරීම මෙන්ම ජනනය වන කසල ප්‍රමානය පිලිබඳව දත්ත ගාල්ල මහා නගර සභාව වෙත ලබාදීම වැනි කසල කලමනාකරන සැලසුමකට අදාල සෑම මල් ශාලාවක අවමංගල්‍යය ශාලාවක හිමිකරුවෙකුම ගාල්ල මහා නගර සභාව සමග එලඹිය යුතු වන්නේය.

(iv) සෑම මල් ශාලාවක අවමංගල්‍යය ශාලාවක, හිමිකරුවකුම විසින් අදාල මල් ශාලාවක අවමංගල්‍යය ශාලාවේ කසල කලමණාකරණය පිලිබඳ වගකීම දරන සේවකයෙක් / සේවිකාවක් නම් කර ගාල්ල මහා නගර සභාවේ කසල කලමනාකරන ඒකකය සමග සම්බන්ධ කිරීම සහ අදාල සේවකයෙක් / සේවිකාවක ට අවශ්‍යය පහසුකම් ලබා දීම අදාල සෑම මල් ශාලාවක / අවමංගල්‍යය ශාලාවක, හිමිකරුවකුගේම වගකීම වන්නේය.

(v) (i) වැනි උපවගන්තිය යටතේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග වෙනම බහාලුම් වල තැන්පත් කර ඒවා ඉවත් කරනු ලබන තෙක් යෝග්‍ය ස්ථානයක ගබඩා කළ යුත්තේ ය. (i) වැනි උපවගන්ති යටතේ (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ඒ සඳහාම විශේෂයෙන් සාදන ලද බදුනක හෝ බහාලුමක තැන්පත් කළ යුතු අතර ඒ සඳහා වෙන් කරනු ලැබූ ස්ථානයක තැබිය යුත්තේ ය. 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ එම

මල් ශාලාවට අවමංගල්‍ය ශාලාවට නිකුත් කරනු ලැබූ අදාල බලපත්‍ර වල දක්වා ඇති කොන්දේසි වලට අනුකූලව එම අපද්‍රව්‍ය ඉවත් කළ යුත්තේ ය.

(vi) (i) වැනි උපවගන්තියේ (අ) හා (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ලියාපදිංචි අපද්‍රව්‍ය එක් රැස් කරන්නෙකුට හෝ සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ගෙවීම මත ලියා පදිංචි නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

## කසල එකතුකරන්නන්

21.

i. ගාල්ල මහා නගර සභා සීමාවතුල සියලුම ආකාරයේ කසල එකතුකරන්නන්, කසල ප්‍රවාහනය කරන්නන් කසල එක්රැස් කරන්නන් ,කසල ප්‍රතිචක්‍රීකරණය කරන්නන් සහ පිරිසැකසුම් කරන්නන් සඳහා මහා නගර සභාව විසින් වාර්ශික බලපත්‍රයක් ලබා ගැනීමෙන් ලියාපදිංචි විය යුත්තේය.

ii. මෙහි **උපලේඛනය 9** දැක්වෙන ආකාරයේ ආකෘථියකින් යුත් ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කිරීමෙන් පසු ගාල්ල මහා නගර සභා සීමාව තුල බලපත්‍රයේ දැක්වෙන කාර්ය කිරීමට අවසර පත්‍රයක් නිකුත් කරනු ලබන අතර ඔහුගේ ඇයගේ කාර්යයන් ගාල්ල මහා නගර සභාවේ නාගරික කොමසාරිස් වරයා හෝ වරිය හෝ ඔහු හෝ ඇය විසින් පත්කරනු ලබන නිලධාරියෙක් විසින් අධීක්ෂනය කරනු ලබයි.

iii. අදාල බලපත්‍රය ලබා ගැනීමට බලාපෙරොත්තු වන පුද්ගලයා සිය ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කිරීමේදී සිය කාර්යාවලිය තුල එකතුකිරීමට බලා පොරොත්තු වන අපද්‍රව්‍යය වර්ගය, අපද්‍රව්‍යය ප්‍රමානය ,අපද්‍රව්‍යය ප්‍රවාහනය, තාවකාලිකව ගබඩාකිරීම ප්‍රතිචක්‍රි කරනය කරනු ලබන හෝ සහ පිරිසැකසුම් කරන ක්‍රමවේදය, ස්ථානය එම කාර්යාවලියේදී ජනිතවීමට නියමිත අපද්‍රව්‍යය, අපද්‍රව්‍යය අවම කිරීමේ ක්‍රමවේද පිලිබඳ ක්‍රම සහිත අපද්‍රව්‍යය කලමනා කරන සැලැස්මක් ගාල්ල මහා නගර සභාව වෙත ලබා දීම සිදුකල යුතුය. එම අපද්‍රව්‍ය කලමණාකරන සැලසුම සලකා බලා ගාල්ල මහා නගරසභාවේ කොමසාරිස් වරයා හෝ වරිය විසින් ඉදිරිපත් කරන ලබන කොන්දේසි සහ උපමාන වලට අනුකූලව සකස් කරන ලද අපද්‍රව්‍යය කලමණාකරන සැලසුම අනුමත කරනු ලබයි.

iv. i වැනි උපවගන්තියේ විශේෂයෙන් සඳහන් කර ඇති මහා නගර සභා සීමාවතුල ජංගම හෝ අවිධිමත් කසල එකතුකරන්නන්, කසල ප්‍රවාහනය කරන්නන් කසල එක්රැස් කරන්නන්, කසල ප්‍රතිචක්‍රීකරනය කරන්නන් සඳහා අවසර ගැනීමේදී ගාල්ල මහා නගර සභාවෙන් අවසර පත්‍රයක් ගතයුතු අතර ඒ සඳහා අවසර ලබා දීමේදී මහා නගර සභාව විසින් නියම කරන ලද ගාස්තුවක් අයකරන අතර එයට අමතරව මාසිකව හැසිරවීමට අපේක්ෂිත කසල ප්‍රමානයට සාපේක්ෂ මුදල් තැන්පතුවක් තැබීමට නියම කරනු ලබයි. අදාල මුදල් තැන්පතුව අදාල ස්ථානයේ අපද්‍රව්‍යය නිසිලෙස කලමනාකරනය කර ඇතිබවට ගාල්ල මහා නගර සභාවේ නාගරික කොමසාරිස් වරයා හෝ වරිය විසින් සෑහීමට පත්වූ පසු

අදාල බලපත්‍රයේ කාලසීමාව ඉක්ම ගිය පසු අදාල මුදල් බලපත්‍ර ලාභියාට මුදාහැරීම සිදුකරනු ලබයි.

v. අදාල බලපත්‍ර ලාභියා විසින් සිය කාර්යයන් අතරතුර බලපත්‍රයේ දැක්වෙන කොන්දේසි උපමාන මෙන්ම ගාල්ල මහා නගර සභාව විසින් අනුමත කරන ලද අපද්‍රව්‍යය කලමනාකරන සැලසුමේ කොන්දේසි සහ උපමානයන් කඩකිරීම වරදක් වන අතර අදාල ප්‍රදේශයේ බලපත්‍රය අවලංගු කිරීම හා මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරීමෙන් අනතුරුව දඩුවම් ලෙස දඩමුදලක් නියම කිරීම සිදුකරනු ලබයි.

## දෛනික සංක්‍රමනික ප්‍රජාව

**22.**

i. දෛනික සංක්‍රමන ප්‍රජාව ලෙස හඳුන්වනු ලබන්නේ ගාල්ල මහනගර සභා සීමාව තුලට දෛනිකව විවිධ සේවාවන්, කාර්යයන්, සංචාරය සඳහා පැමිනෙන දේශීය සහ විදේශීය පුද්ගලයන් වේ.

ii. මෙසේ පැමිනෙන දෛනික සංක්‍රමනික ප්‍රජාව විසින් සිය දෛනික කාර්‍යාවලිය තුලදී ජනනය වන කසල පමනක් ගාල්ල මහා නගර සභාව විසින් කසල එකතු කිරීම සඳහා අදාල ස්ථානයේ කසල කලමණාකරනය කිරීමට සකසා ඇති ස්ථාන වල තබා ඇති බඳුන් වලට කසල බැහැර කිරීමට අදාල උපමාන සහ කොන්දේසි වලට අනුව බැහැර කිරීම සිදුකලයුතු වේ. දෛනික සංක්‍රමනික ප්‍රජාව විසින් එසේ කසල බැහැර කිරීමේදී බාහිරින් රැගෙන එන කසල එම ස්ථාන වලට බැහැර කිරීම වරදක් වන අතර නාගරික කොමසාරිස් වරයා හෝ වරිය විසින් බලය පවරනු ලබන නිලධාරියෙකු විසින් එම ක්‍රියාවලිය අධීක්ෂනය කරනු ලබන අතර අදාල කොන්දේසි උල්ලංඝනය කර පුද්ගලයන්ට මහා නගර සභා ආඥා පනත යටතේ නෛතික ක්‍රියාමාර්ග ගනු ඇත.

## පාසල් සහ අනෙකුත් අධ්‍යාපන ආයතන

23.

i. ගාල්ල මහා නගර සභා සීමාව ඇතුලත පාසල් සහ අනෙකුත් අධ්‍යාපන ආයතනවල හිමිකරු, කලමණාකරු, කලමණාකරන මන්ඩලය, විදුහල්පති, පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය. (මෙහි **උපලේඛනය 7** සඳහන් වන අපද්‍රව්‍ය )

(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය.

(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය, ( එනම් විද්‍යුත් අපද්‍රව්‍යය සනීපාරක්ෂක අපද්‍රව්‍යය සායනික අපද්‍රව්‍යය ඉවතලන ඖෂධ වැනි මෙහි **උපලේඛනය 6** සඳහන් වන අපද්‍රව්‍යය )

(ඈ) සතුන්ගේ මළකුණු, ශරීර කොටස් සහ අසූචි,

ii. ඉහත කාන්ඩ වලට අයත් නොවන අපද්‍රව්‍යයක් ජනිත වූයේනම් ඒ පිලිබඳව අදාල ජනිත කරන්නා විසින් ගාල්ල මහා නගරසභාව වෙතින් ලිඛිත උපදෙස් ලබාගෙන ගාල්ල මහා නගරසභාව විසින් ගාල්ල මහා නගරසභාව ලබාදෙන ලිඛිත උපදෙස් වලට අනුකූලව කටයුතු කලයුතුය.

iii. කසල ජනනය වීම අවම කිරීමට සහ ඉහත පරිදි වෙන්කරන ලද කසල එකතුකිරීම තාවකාලිකව ගබඩාකිරීම සහ බැහැර කිරීම පිලිබඳව පසුවිපරම් කිරීම මෙන්ම ජනනය වන කසල ප්‍රමානය පිලිබඳව දත්ත ගාල්ල මහා නගර සභාව වෙත ලබාදීම වැනි කසල කලමනාකරන සැලසුමකට අදාල සෑම පාසල් සහ පෞද්ගලික අධ්‍යාපන ආයතන වල හිමිකරු, කලමණාකරු, කලමණාකරන මන්ඩලය, විදුහල්පති, ගාල්ල මහා නගර සභාව සමග එලඹිය යුතු වන්නේය.

iv. සෑම පාසල් සහ පෞද්ගලික අධ්‍යාපන ආයතන වල හිමිකරු, කලමණාකරු, කලමණාකරන මන්ඩලය, විදුහල්පති, විසින් අදාල පාසල් සහ පෞද්ගලික අධ්‍යාපන ආයතන වල කසල කලමණාකරණය පිලිබඳ වගකීම දරන සේවකයෙක් / සේවිකාවක් නම් කර ගාල්ල මහා නගරසභාවේ කසල කලමනාකරන ඒකකය සමග සම්බන්ධ කිරීම සහ අදාල සේවකයෙක් / සේවිකාවක ට අවශ්‍යය පහසුකම් ලබා දීම අදාල සෑම පාසල් සහ පෞද්ගලික අධ්‍යාපන ආයතන වල හිමිකරු, කලමණාකරු, කලමණාකරන මන්ඩලය, හෝ විදුහල්පතිගේ වගකීම වන්නේය.

v. ගාල්ල මහා නගර සභාව විසින් ඉල්ලීමක් සිදුකල විට අදාල බලධාරීන්ගේ අවසරය සහිතව මහනගර සභාව විසින් පවත්වනු ලබන අපද්‍රව්‍යය කලමණාකරන වැඩමුලු දේශන සහ සම්මන්ත්‍රන සඳහා අදාල පාසල් සහ පෞද්ගලික අධ්‍යාපන ආයතන වල සිසුන් සහ අදාල සේවක සේවිකාවන් සහභාගීකිරීම සහ අදාල අපද්‍රව්‍යය කලමණාකරන වැඩමුලු දේශන සහ සම්මන්ත්‍රන සඳහා අවශ්‍යය පහසුකම් ලබා දීම අදාල සෑම පාසල් සහ පෞද්ගලික අධ්‍යාපන ආයතන වල හිමිකරු, කලමණාකරු, කලමණාකරන මන්ඩලය, විදුහල්පතිගේ වගකීම වන්නේය.

vi. **පාසල් සහ අනෙකුත් අධ්‍යාපන ආයතන-** ඉහත ආකාරයට පටහැනිව සිය කසල බැහැර කිරීම වරදක් වන අතර පෞද්ගලික අධ්‍යාපන ආයතන වල හිමිකරු, කලමණාකරු, කලමණාකරන මන්ඩලය, විදුහල්පති වරයාට එරෙහිව අදාල ප්‍රදේශයේ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරීමකින් අනතුරුව වරදකරු කිරිමෙන් අනතුරුව දඩමුදලක් නියම කිරීමට හැකිය.

## වෙනත් පරිශ්‍රයන්

24. (i) අංක 8 සිට 19 දක්වා වන අතුරු ව්‍යවස්ථාවන්හි විශේෂයෙන් සඳහන් කර නොමැති ගාල්ල මහා නගර සභා සීමාව තුල ව්‍යාපාරයක් කරගෙන යන යම් තැනැත්තෙක් හෝ මහජනතාවගේ සහභාගීත්වය ඇතිව පොදු ආගමික, සමාජයීය, සංස්කෘතික, විනෝදාස්වාදය සඳහා පවත්වනු ලබන උත්සව , හෝ අධ්‍යාපනික ක්‍රියාකාරකමක් සංවිධානය කරන හා ක්‍රියාත්මක

කරන යම් තැනැත්තෙක් අදාල ක්‍රියාකාර කම සිදුකිරීමට ප්‍රථම මහා නගර සභාවෙන් අවසර ලබා ගතයුතුය. එකී ක්‍රියාකාරකම් නිසා ජනනය වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය. (මෙහි **උපලේඛනය 7** සඳහන් වන අපද්‍රව්‍ය )

(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය.

(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය, ( එනම් විද්‍යුත් අපද්‍රව්‍යය සනීපාරක්ෂක අපද්‍රව්‍යය සායනික අපද්‍රව්‍යය ඉවතලන ඖෂධ වැනි මෙහි **උපලේඛනය 6** සඳහන් වන අපද්‍රව්‍යය )

(ඈ) සතුන්ගේ මළකුණු, ශරීර කොටස් සහ අසූචි,

(ii) ඉහත කාන්ඩ වලට අයත් නොවන අපද්‍රව්‍යයක් ජනිත වූයේනම් ඒ පිලිබඳව අදාල ජනිත කරන්නා විසින් ගාල්ල මහා නගරසභාව වෙතින් ලිඛිත උපදෙස් ලබාගෙන ගාල්ල මහා නගරසභාව විසින් නගරසභාව ලබාදෙන ලිඛිත උපදෙස් වලට අනුකූලව කටයුතු කලයුතුය.

(iii) (i) වැනි උපවගන්තියේ විශේෂයෙන් සඳහන් කර ඇති යම් ක්‍රියාකාරකමක් සඳහා අවසර ලබාගන්නා අවසර ලාභියෙක් එම ක්‍රියාකාරකම නිසා ජනනය වන්නා වූ අපද්‍රව්‍ය ජනනය කිරීම අවම කිරීමට යෝජනා කරනු ලබන ක්‍රමවේදයන් සහ (i) වන උපවගන්තියේ ඇති ආකාරයට අපද්‍රව්‍යය එක්රැස් කිරීම වෙන්කිරීම සහ බැහැරකිරීම තාවකාලිකව ගබඩා කිරීම පිලිබඳව මෙන්ම එය ක්‍රියාත්මක කරනු ලබන ආකාරය පිලිබඳව සහ අදාල ක්‍රියාකාර කම තුලින් ජනනය වියහැකියයි උපකල්පනය කර ඇස්තමේන්තු ගතකරන අපද්‍රව්‍යය ප්‍රමානය පිලිබඳව විස්තරාත්මක සැලසුමක් අවසර ලබාගැනීමට ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම්පත්‍රය සමග මෙහි **10 උපලේඛනයේ** සඳහන් ආකාරයට ගාල්ල මහා නගර සභාවට ඉදිරිපත් කලයුතුය.

(iv) (i) වැනි උපවගන්තියේ විශේෂයෙන් සඳහන් කර ඇති යම් ක්‍රියාකාරකමක් සංවිධානය කරන කෙනෙක් අදාල ක්‍රියාකාරකම පැවැත්වීමට අවසර ගැනීමේදී ගාල්ල මහා නගර සභාවෙන් අවසර ගතයුතු අතර ඒ සඳහා අවසර ලබා දීමේදී ගාල්ල මහා නගර සභාව විසින් මුදල් තැන්පතු දෙකක් භාරගනු ලබන අතර පලමු තැන්පතුව අදාල ක්‍රියාකාරකම අවසානයේ අදාල ක්‍රියාකාරකම මගින් ජනනය වන ලද අපද්‍රව්‍යය නිසිලෙස එක්රැස් කිරීම වෙන්කිරීම සහ බැහැරකිරීම සහ තාවකාලිකව ගබඩා කිරීම පිලිබඳව සෑහීමකට පත්වූ පසු අදාල බලපත්‍ර ලාභියා වෙත මුදාහරිනු ලබනු ඇත.

(v) දෙවන මුදල් තැන්පතුව අදාල ක්‍රියාකාරකමින් ජනනය වීමට අපේක්ෂිත අපද්‍රව්‍යය ප්‍රමානයට අනුකූලව අයකරනු ලබන අතර එය **උපලේඛනය 11** දැක්වෙන ආකාරයට අනුව අයකරනු ලබයි. අදාල ක්‍රියාකාරකම අවසානයේ අදාල ස්ථානයේ ජනනය වූ අපද්‍රව්‍යය ඇස්තමේන්තු ගත ප්‍රමානයට අනුකූල වූ විට එය නිසිලෙස බැහැර කිරීමට මහනගරසභාව විනිසින් භාරගැනීමේදී එයට හිලව් වන ගාස්තුව ලෙස අයකරගනු ලැබේ. යම් හෙයකින් අදාල ක්‍රියාකාරකම අවසානයේ ඇස්තමේන්තු ගත අපද්‍රව්‍යය ප්‍රමානය උපකල්පිත ඇස්තමේනතු ගත අපද්‍රව්‍යය පමානයට 5% ට වඩා ඉක්ම

යන්නේනම් උපලේඛණය අනුව තැන්පත්කරන ලද මුදල් තැන්පතුවට අදාලව 25% අධිභාරයක් බලපත්‍රලාභියා විසින් නගර සභාවට ගෙවිය යුතුය. කසල ගාල්ල මහ නගර සභාව වෙත භාර දෙනවිට උපලේඛනය 11 දැක්වෙන ආකාරයට මිශ්‍ර කසල සඳහා මෙන්ව වෙන්කරන ලද කසල සඳහා අයකරන ගාස්තු වෙනස් වනු ඇත.

(vi) (i) වැනි උපවගන්තිය යටතෙ දැක්වෙන ක්‍රියාකාරකමක් සඳහා ගාල්ල මහ නගර සභාවෙන් බලපත්‍රයක් ලබාගන්නා ලද පුද්ගලයෙක් අදාල ක්‍රියාකාර කම අවසානයේ ජනිත වෙනු ලබන අපද්‍රව්‍යය (i) වැනි උපවගන්තියේ දැක්වෙන ආකාරයට වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය ඉවත් කරගනු ලබන තෙක් වෙනම බහාලුම් වල අසුරා සුදුසු ස්ථානයක ගබඩා කළ යුත්තේ ය.

## කසලකලමණාකරනය පිලිබඳ පුහුනු මධ්‍යස්ථානයක් පිහිටුවීම.

25.

i. මෙම අතුරු නීතියේ පරමාර්ථය ඉටුකර ගැනීමේ අරමුන ප්‍රකාරව ගාල්ල මහා නගර සභාව විසින් අපද්‍රව්‍යය කලමනාකරනය පිලිබඳ කසල කලමණාකරනය පිලිබඳ පුහුනු මධ්‍යස්ථානය ලෙස හඳුන්වනු ලබන ආයතනයක් පිහිටුවනු ලැබිය හැකිය.

**ii.** මෙම අතුරු නීතිය අනුව පිහිටවනු ලබන කසල කලමනාකරනය පිලිබඳ පුහුනු මධ්‍යස්ථානයේ බලතල හා කාර්යය ඉටුකරගැනීමට කසල කලමනාකරනය පිලිබඳ පුහුනු මධ්‍යස්ථානයේ කලමණාකරු/අධ්‍යක්ෂක යනුවෙන් හඳුන්වනු ලබන පරිපාලන ලේකම් වරයෙකු හෝ වරියක් සහ කලින් කලට අවශ්‍යය වියහැකියයි මහා නගර සභාව විසින් තීරනය කරනු ලබන වෙනත් යම් නිලධාරින් හෝ නිලධාරිනියන් සහ සේවකයන් පත්කරනු ලැබිය හැකිය. එම තනතුරට කසල කලමණාකරනයට සම්බන්ධ විශේෂ අධ්‍යාපන සුදුසුකම් සහ විශේෂ ප්‍රාගුන්‍යයක් සහිත නිලධාරියෙක් පත් කලයුතුය.

**iii. අපද්‍රව්‍යය කලමනාකරනය පිලිබඳ වෘතීය පුහුනු මධ්‍යස්ථානයේ කාර්යභාරය.**

i. අපද්‍රව්‍යය වෙන් කිරීම, ගබඩා කිරීම, එක්රැස් කිරීම, ප්‍රවාහනය කිරීම, මාරු කරන ස්ථාන ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම, සැකසීම, පිරියම් කිරීම හා බැහැර කිරීම සම්බන්ධයෙන් වන නියාමනය, අධීක්ෂණය, පරීක්ෂාව හා පාලනය සඳහා වූ නව ක්‍රමවේදයන් අධ්‍යයනය කිරීම සහ ඒ පිලිබඳව ප්‍රතිපත්ති සම්පාදයනය.

ii. පලාත් පාලන ආයතන වල අපද්‍රව්‍යය කලමනාකරනය පිලිබඳ තාක්ෂණික හා නවෝත්පාදන පදනමකින් යුක්ත සැලසුම් සකස් කිරීම කසල කලමණාකරනය පිලිබඳ සමීක්ෂනය කසල විගනනය හා තක්සේරුකරණය හා කසල කලමණාකරනයට අදාල අනෙකුත් සේවාවන් සැපයීම. .

iii. අපද්‍රව්‍යය වෙන් කිරීම, ගබඩා කිරීම, එක්රැස් කිරීම, ප්‍රවාහනය කිරීම, මාරු කරන ස්ථාන ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම, සැකසීම පිරිසැකසුම් කිරීම හා බැහැර කිරීම සම්බන්ධයෙන් වන නියාමනය, අධීක්ෂණය, පරීක්ෂාව හා පාලනය

සඳහා වූ නව තාක්ෂණික ක්‍රමවේදයන් පිලිබඳ පාඨමාලාවක් සංස්ථාපනය කර පවත්වාගෙන යාම.

iv. ශ්‍රී ලංකා තෘතීය අධ්‍යාපන කොමිෂන් සභාව සමග ඒකාබද්ධව අපද්‍රව්‍යය වෙන් කිරීම, ගබඩා කිරීම, එක්රැස් කිරීම, ප්‍රවාහනය කිරීම, මාරු කරන ස්ථාන ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම, සැකසීම, පිරියම් කිරීම හා බැහැර කිරීම සම්බන්ධයෙන් වන නියාමනය, අධීක්ෂණය, පරීක්ෂාව හා පාලනය සඳහා වූ නව තාක්ෂණික ක්‍රමවේදයන් පිලිබඳ පාඨමාලාව සඳහා රාජ්‍යය අංශයේ පලාත්පාලන ආයතන වල සහ පෞද්ගලික අංශයේ උනන්දුව දක්වන පිරිස් බඳවා ගැනීම පාඨමාලාව පවත්වාගෙන යාම කඩඉම් පරීක්ෂාවෙන් පසු අදාල පිරිස් සඳහා අපද්‍රව්‍යය කලමනාකරනය පිලිබඳ ජාතික වෘතීය සුදුසුකම් සහතිකය (NVQ) නිකුත්කිරීම.

v. ගාල්ල මහා නගර සභා සීමාව තුල වෙසෙන තරුණයන් / තරුණියන් කාන්තාවන් ප්‍රජා සංවිධාන පාසල් අධ්‍යාපන ආයතන පෞද්ගලික අධ්‍යාපන ආයතන රජයේ කාර්යාල පෞද්ගලික ආයතන හෝටල් සංචාරක හෝටල් බන්ධනාගාර හමුදා කඳවුරු පොලිස් ස්ථාන සහ පොලිස් කඳවුරු ධීවර සමිති සහ ධීවර වරාය ඉලක්ක කරමින් කාලීනව අපද්‍රව්‍යය කලමනා කරනය පිලිබඳ වැඩමුලු සංවිධානය සහ පැවැත්වීම.

vi. අපද්‍රව්‍යය කලමනාකරනය කිරීම සහ නිසිලෙස අපද්‍රව්‍යය කලමනාකරනය නොකරන ස්ථාන පිලිබඳව අධීක්ෂනය සඳහා ප්‍රජාව මත පදනම් වූ ආරක්ෂන ජාලයක් ස්ථාපිත කිරීම සහ අධීක්ෂණය.

vii. ගාල්ල මහා නගර සභා වට අදාලව කසල කලමණාකරනය පිලිබඳ විශ්ලේෂනය කසල විගනනය හා තක්සේරු කරනය හා කසල කලමණාකරනයට අදාලව වියදම් විශ්ලේෂනයක් සෑම වසර තුනකටම එක් වරක් සිදුකිරීම.

viii. ගාල්ල මහා නගර සභා සීමාව තුල සියලුම ආයතන විසින් ලබා දෙන අපද්‍රව්‍යය කලමණාකරන සැලසුම් දත්ත සහ තොරතුරු එකතු කිරීම විශ්ලේශනය කිරීම සහ මාසික වාර්තාවක් සකස්කොට ගාල්ල මහා නගරසභාවට ඉදිරිපත් කිරීම.

## වීථි හා පොදු ස්ථාන

26. (i) ගාල්ල මහා නගරසභා කොමසාරිස් වරයා විසින් නගරාධිපති සමග සාකච්ඡා කර සභාවේ අනුමැතියට යටත්ව පහත දැක්වෙන කාර්යයන් සැලසුම් කිරීමට, පාලනය කිරීමට සහ පරිපාලනය කිරීමට පියවර ගත යුත්තේ ය.

(අ) ගාල්ල මහා නගර සභා ප්‍රදේශය තුළ පිහිටි විථි, පොදු ස්ථාන, මංමාවත්, පොදු කාණු, ජල මාර්ග සහ පොදු වෙළඳ පොලවල් පිරිසිදු හා සනීපාරක්ෂක තත්ත්වයෙන් පවත්වා ගැනීම;

(ආ) ගාල්ල මහා නගර සභා නේවාසික ප්‍රදේශයන්හි සවිකර ඇති පොදු අපද්‍රව්‍ය බක්කි හෝ බහාලුම් සනීපාරක්ෂක තත්ත්වයෙන් පවත්වා ගැනීම සහ ඒ ආසන්නයේ පදිංචි වැසියන්ට එය පීඩාවක් වීමට පෙර එම බක්කිවල හා බහාලුම්වල තැන්පත් කර ඇති අපද්‍රව්‍ය ඉවත් කිරීම;

(ඇ) පූර්වගාමී වගන්තිවල විශේෂයෙන් සඳහන් කර ඇති ක්‍රියාකාරකම් පිළිබඳව ලැබුණු යම් පැමිණිල්ලක් විමර්ශනය කිරීම හා අප්‍රමාදව ඒ ගැන ක්‍රියා කිරීම.

(ii) ගාල්ල මහ නගර සභාව විසින් විශේෂයෙන්ම කුණු රොඩු සඳහා සපයනු ලබන යම් බක්කියක තෙතමනය සහිත, වානිජමය ආයතනික, කාර්මික අපද්‍රව්‍ය හෝ වෙනත් අපද්‍රව්‍ය තැන්පත් කිරීම කිසිම තැනැත්තෙක් නොකළ යුත්තේය.

## මහනගර සභාවේ වගකීම

27. (i) ගාල්ල මහා නගර සභා කොමසාරිස් වරයා විසින් නගරාධිපති සමග සාකච්ඡා කර සභාවේ අනුමැතියට යටත්ව පහත දැක්වෙන කාර්යයන් සැලසුම් කිරීම, අධීක්ෂණය කිරීම, පාලනය කිරීම සහ පරිපාලනය කළ හැක්කේ ය.

(අ) අපද්‍රව්‍ය අඩු කිරීමට, ප්‍රතිභාවිතයට හා ප්‍රතිචක්‍රීකරණයට ජනතාව ධෛර්යමත් කිරීම:

(ආ) අපද්‍රව්‍ය තෝරා වෙන් කිරීම, එක් රැස් කිරීම, ගබඩා කිරීම, මුදාහැරීම සහ බැහැරලීම සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම හෝ මාධ්‍ය මගින් ප්‍රචාරණය කිරීම;

(ඇ) ප්‍රතිභාවිතාකරණය හා ප්‍රතිචක්‍රීකරණ කටයුතුවල නියුක්ත පුද්ගලයින්ට හා කුඩා ව්‍යවසායකයින්ට පහසුකම් සැපයීම;

(ඈ) අපද්‍රව්‍ය අඩු කිරීමේ, ප්‍රතිභාවිතා කිරීමේ හා ප්‍රතිචක්‍රීකරණය කිරීමේ ක්‍රියාකාරකම් වලට සම්බන්ධ වී සිටින අයට දිරි ගැන්වීම පිරිනැමීම;

(ඉ) අපද්‍රව්‍ය මුදාහැරීමේ ක්‍රම පිළිබඳ වෙනස් ආකෘති නියාමනය කිරීම:

(ඊ) ගාල්ල මහා නගර සභා ප්‍රදේශයේ එක් එක් ප්‍රදේශයන්හි එක් එක් අපද්‍රව්‍ය වර්ග සඳහා නගර සභාව විසින් තීරණය කරනු ලබන පරිදි අපද්‍රව්‍ය එක්කාසු කරන දිනයන්, වේලාවන්, ක්‍රම වේදයන් හා ගාස්තු සඳහන් කරමින් අපද්‍රව්‍ය එක් කිරීමේ කාර්යය සටහනක් පිළියෙල කිරීම සහ ප්‍රසිද්ධ නිවාඩු දිනයන්හි අපද්‍රව්‍ය එක්රැස් කිරීම සඳහා වන කොන්දේසි එම කාර්යය සටහනට ඇතුළත් කිරීම:

(උ) ගාල්ල මහා නගර සභාවේ ලියාපදිංචි අපද්‍රව්‍ය එක්රැස් කරන්නන්ට වෙනම භාරදෙනු නොලැබූ යම් වෙන්කරන ලද අපද්‍රව්‍යයක් කාර්ය සටහ අනුව නියමිත වේලාවට එක් රැස් කිරීම:

(උ) ගාල්ල මහ නගර සභාවේ ලියාපදිංචි අපද්‍රව්‍ය එක් රැස් කරන්නන්ට භාරදෙනු නොලැබූ අන්තරායකාරී අපද්‍රව්‍ය සහ වෙනත් යම් අපද්‍රව්‍ය සනීපාරක්ෂක ආකාරයෙන් ප්‍රවාහනය කිරීම:

(ඒ) අන්තරායකාරී අපද්‍රව්‍ය හෝ කොමසාරිස් වරයා හෝ වරිය විසින් නියම කරන ලද වෙනත් යම් අපද්‍රව්‍ය වර්ග හැර වීථි අතුගෑමෙන්, කාණු පිරිසිදු කිරීමෙන් සහ පොදු ස්ථාන පිරිසිදු කිරීමෙන් එක්රැස් කෙරෙන අපද්‍රව්‍ය පොදු බක්කිවලින් එක්රැස් කෙරෙන අපද්‍රව්‍ය සහ ගාල්ල මහා නගර සභාවේ කම්කරුවන් විසින් එක්රැස් කරනු ලබන අපද්‍රව්‍ය ගාල්ල මහා නගර සභාවේ බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදීම.

(ඒ) ගාල්ල මහා නගර සභා ප්‍රදේශයේ ආහාර සහ වෙනත් ජෛව ජීර්ණනීය ප්‍රතිභාවිතාකරණීය අපද්‍රව්‍ය ප්‍රායෝගිකව කළ හැකිතාක් මුළුමනින්ම හෝ කොටසක් හෝ සැකසීමට හා පිරියම් කිරීමට වැඩ පිළිවෙළක් ද ඇතුළත්ව ගාල්ල මහා නගර සභාවේ ලියාපදිංචි නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නන් විසින් එක්රැස් කරනු ලබන, වෙන් කරන ලද, අපද්‍රව්‍ය සම්බන්ධයෙන් කටයුතු කිරීමට සහ එම ක්‍රියාන්විතයන්ගෙන් ප්‍රතික්ෂේප වන හා මෙම අපද්‍රව්‍ය වර්ගවල වෙනත් අවශේෂ අපද්‍රව්‍ය ගාල්ල මහා නගර සභාවේ කොමසාරිස් වරයා හෝ වරිය අනුමත කරන ආකාරයට බැහැරලීමට යෝග්‍ය පියවර ගැනීම,

(ඔ) මධ්‍යම පරිසර අධිකාරිය සමග සාකච්ඡා කර ගාල්ල මහා නගර සභාවේ කොමසාරිස් වරයා විසින් අනුමත කරනු ලබන ආකාරයට සියලුම අන්තරායකාරී අපද්‍රව්‍ය බැහැර කිරීම,

(ඕ) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ විධිවිධාන අනුව බලපත්‍රයක් හෝ පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබාගැනීම සහ එම බලපත්‍රයේ හෝ පරිසර ආරක්ෂණ බල පත්‍රයේ විශේෂයෙන් සඳහන් කර ඇති කොන්දේසිවලට යටත්ව අපද්‍රව්‍ය පිරිසැකසුම් කිරීම හෝ පිළිස්සීම හෝ සනීපාරක්ෂක බිම් පිරවුමක් පවත්වාගෙන යාම,

(ක) අපද්‍රව්‍ය අතුගෑම, එක්කාසු කිරීම, තෝරා වෙන් කිරීම. ප්‍රවාහනය කිරීම, මාරු කිරීම හා බැහැරලීම යන කාර්යයන් හි නිරතවන සෑම සේවකයෙකුට සම්මත සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුව සුදුසු ඇඳුම්, අත් ආවරණ, මුඛ ආවරණ, බූට් සපත්තු සහ අනෙකුතු මෙවලම් සැපයීම.

(ග) නිවෙසක් හෝ වෙනත් පරිශ්‍රයක් ඉදිකිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා සභාවට ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක දී ඉදිකිරීම හෝ ප්‍රතිසංස්කරණය නිසා ජනනය වන්නා වූ ඝන අපද්‍රව්‍ය බැහැරලන ආකාරය සහ නියමිත වැඩය ආරම්භ

කරන අදියරේ දී හා නිමවීමේ දී සක්කගල් ගබඩා කරනු, සකසනු හා බැහැරලනු ලබන ආකාරය පිළිබඳ විස්තර පරික්ෂා කිරීම හා අනුමත කිරීම.

(ජ) ගාල්ල මහා නගර සභා පරිශ්‍රය සඳහා අභ්‍යන්තර අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්මක් පිළියෙළ කිරීම,

(ට) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික උපාය මාර්ගය සහ අදාළ නීතියට අනුකූලව සවිස්තර වශයෙන් යටත් පිරිසෙයින් එක් එක් ලිත් වර්ෂය ආවරණය කරන හා අවසාන බැහැරලීම සම්බන්ධයෙන් වර්ෂ 03 ක් ඉදිරියට ආවරණය කරන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාත්මක සැලැස්මක් පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම, එම සැලැස්ම එය ආවරණය කරන කාලසීමාව අනුව නිරන්තර පදනම මත සභාව විසින් වාර්ෂිකව අනුමත කරනු ලැබීම.

(ඩ) (අ) සිට (ට) දක්වා අයිතමයන්හි සඳහන් වන ක්‍රියාකාරකම සම්බන්ධයෙන් ලැබෙන යම් පැමිණිල්ලක් එය අදාළ වන්නේ උද්ගත විය හැකි පීඩාවකට නම් දින තුනක් ඇතුළතත් වෙනත් පැමිණිල්ලක් නම් දින දාහතරක් ඇතුළතත් විමර්ශනය කිරීම හා වහාම අවශ්‍ය කටයුතු කිරීම.

(ණ) ගාල්ල මහා නගරසභා කසල කලමනාකරන භූමියේ සනීපාරක්සාව සඳහා නිසි තාක්ෂනික ක්‍රමවේද භාවිතා කරමින් සැලසුමක් සකස්කිරීම සහ අඛන්ඩව එය පවත්වාගෙන යාම.

(ත) ගාල්ල මහා නගරසභා කසල කලමණාකරන ඒකකයේ රථ වාහන වල මනා ක්‍රියාකාරීත්වය සුරක්ෂිත භාවය පවත්වාගෙන යාම සහ කසල කලමණාකරන යට අදාලව කටයුතු කරන්නන් සඳහා රක්ෂන ආවරණයක් ලබා දීම.

(ද) ගාල්ල මහා නගර සභා සීමාව තුල කසල ආශ්‍රිත පුතිචක්‍රී කරන ක්‍රියාවලිය තුලින් නව නිපැයුම් සඳහා දිරි ගැන්වීම.

## අවසර පත්‍ර

28. (i) ගාල්ල මහා නගර සභා ප්‍රදේශයේ අපද්‍රව්‍ය ප්‍රතිභාවිතයට ගන්නා වූ සහ ප්‍රතිචක්‍රීකරණය කරන්නා වූ හෝ කොම්පෝස්ට්, ජීව වායු හෝ වෙනත් නිපැයුමක් නිර්මාණය කරන්නා වූ යම් තැනැත්තෙක් පහත දැක්වෙන කරුණු අදාලත්වය අනුව එකක් හෝ කිහිපයක් සපුරාලන්නේ නම් ඔහුට සභාව විසින් අවසර පත්‍රයක් නිකුත් කරනු ඇත.

(අ) ගාල්ල මහා නගර සභාව විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා ප්‍රකාර නාගරික ප්‍රදේශය ඇතුළත හෝ වෙනත් පළාත් පාලන ආයතන ප්‍රදේශයක හෝ යම් ව්‍යාපාරයක් කරගෙන යාම.

(ආ) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ විධිවිධාන අනුව නිකුත් කරනු ලබන පරිසර ආරක්ෂණ බලපත්‍රයක් සතුව තිබීම.

(ඇ) එක්රැස් කරන ලද අපද්‍රව්‍ය සඳහා සභාව විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට අනුකූලව ඉදිකරනු ලබන අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ මධ්‍යස්ථාන සැපයීම.

(ඈ) එක්රැස් කරන ලද අපද්‍රව්‍ය ගාල්ල මහා නගර සභාවේ කොමසාරිස් වරයා විසින් අනුමත කරනු ලබන පරිදි හා ජනතාවට පීඩාවක් සිදු නොවන සනීපාරක්ෂක ක්‍රමයකට ප්‍රවාහනය කිරීම සඳහා වාහන සැපයීම.

(ඉ) අදාළ ව්‍යාපාරය නගර සභා සීමාවක් ඇතුළත කරගෙන යනු ලබන විටෙක දී ගාල්ල මහා නගර සභව විසින් කලින් කලට තීරය කරනු ලබන පරිදි එකී අපද්‍රව්‍ය එක් රැස් කිරීම සඳහා ගාස්තුවක් කොමසාරිස් වරයාට ගෙවීම මත අපද්‍රව්‍ය සැකසීමේ දී හෝ පිරියම් කිරීමේ දී අවශේෂ වන්නා වූ හෝ ප්‍රතික්ෂේප වන්නා වූ හෝ අතුරු නිෂ්පාදන වශයෙන් නිර්මාණය කෙරෙන්නා වූ අපද්‍රව්‍ය ගාල්ල මහා නගර සභාව විසින් අනුමත කරනු ලබන පරිදි ගාල්ල මහ නගර සභාවට භාරදීමට එකඟ වීම.

(ii) ගාල්ල මහා නගර සභාව විසින් අවසර පත්‍රයක් නිකුත් කිරීම ප්‍රතිකෙෂ්ප කළ විටෙක හෝ නිෂ්ප්‍රභා කළ විටෙක ඉල්ලුම්කරු ඉල්ලා සිටිය හොත් එසේ ප්‍රතික්ෂේප කිරීමට හා නිෂ්ප්‍රභා කිරීමට හේතු බලපත්‍රය සඳහා ඉල්ලුම්පත්‍රය ලැබී දින 30 ක් ඇතුළත ලිඛිතව ඉල්ලුම්කරුට දැනුම් දිය යුත්තේ ය.

(iii) ගාල්ල මහා නගර සභාවේ කොමසාරිස් වරයා විසින්, වලංගු කාල පරිච්ඡේදය තුළ එක්රැස් කිරීමට අවසර දෙනු ලබන අපද්‍රව්‍ය වර්ගය හෝ වර්ග එකී අපද්‍රව්‍ය එක් රැස් කිරීමට අවසර දෙනු ලබන ප්‍රදේශය සහ වෙනත් සුදුසු කොන්දේසි අවසර පත්‍රයේ දැක්විය යුත්තේ ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ විධිවිධාන වලට අනුකූලව ක්‍රියා නොකරන අවස්ථාවක දී මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුක් කරනු ලැබූ අවසර පත්‍රය අවලංගු කළ යුත්තේ ය.

(v) (iv) වැනි උපවගන්තියේ විධිවිධාන යටතේ අවසර පත්‍රයක් අවලංගු කරනු ලැබූ අවස්ථාවක දී කිසියම් තැනැත්තෙක් අපද්‍රව්‍ය එක්රැස් කිරීම හෝ ලබා ගැනීම් හෝ නොකළ යුත්තේ ය. එවැනි අවස්ථාවක දී අවසර පත්‍රය අවලංගු කරනු ලැබූ බවට ජනතාව දැනුවත් කිරීම පිණිස කොමසාරිස් වරයා මාධ්‍ය මගින් ප්‍රමාණවත් ප්‍රචාරයක් ලබාදිය යුත්තේ ය.

## අපද්‍රව්‍ය බැහැරලන ප්‍රදේශ

29. සභාව විසින් අපද්‍රව්‍ය බැහැරලීමේ කාර්යය සඳහා වෙන් කරන ලද ප්‍රදේශයට අවසර නොලත් තැනැත්තෙක් ඇතුළු නොවිය යුතු හා එහි නොගැවසිය යුතු අතර, එම ප්‍රදේශයේ යම් භාණ්ඩයක්, ද්‍රව්‍යයක් හෝ ඉවතලන දෙයක් තැන්පත් කිරීම, බාධා කිරීම හෝ ඉවත් කිරීම නොකළ යුත්තේ ය. කිසිම තැනැත්තෙක් විශේෂයෙන් නියම කරනු ලබන කොන්දේසිවලට යටත්ව සභාව විසින් අවසර දෙනු ලැබුවහොත් මිස සභාව විසින් කලින් කලට නියම කරනු ලැබිය හැකි යම් තහනම් කරන ලද අපද්‍රව්‍ය තැන්පත් නොකළ යුත්තේ ය.
30. ගාල්ල මහා නගර සභාවේ දේපලක් වන අපද්‍රව්‍යය බැහැර කිරීමේ භූමිය විධිමත්ව පවත්වාගෙන යමින් එම භූමිය සම්පත් ප්‍රතිසාධන මධ්‍යස්ථානයක් ලෙස වැඩිදියුනු කිරීම ගාල්ල මහනගර සභාවේ වගකීම වන්නේය.
31. ගාල්ල මහා නගර සභාවේ දේපලක් වන අපද්‍රව්‍යය බැහැර කිරීමේ භූමිය විධිමත්ව පවත්වාගෙන යමින් එම භූමිය සෞඛ්‍යාරක්ෂිතව පවත්වාගෙන යාම ගාල්ල මහා නගරසභාවේ වගකීම වන්නේය.

32. අනුමත කිරීමේ යම් කොන්දේසිවලට යටත්ව නාගරික කොමසාරිස් වරයා හෝ වරිය සහ මධ්‍යම පරිසර අධිකාරියේ පූර්ව ලිඛිත අනුමැතිය ඇතිව මිස කිසිම තැනැත්තෙක් නගර සභා සීමාවන් ඇතුළත පිහිටි යම් ඉඩමක් හෝ පහසුකමක් එයට පිටස්තර ස්ථානයක ජනනය වන්නා වූ අපද්‍රව්‍ය තැන්පත් කිරීම සඳහා සැපයීම හෝ භාවිතා කිරීම නොකළ යුත්තේ ය.

## වෙනත්

33. (i) ගාල්ල මහා නගර සභාවේ නගරාධිපති වරයා හෝ වරිය විසින් හෝ නාගරික කොමසාරිස් වරයා හෝ වරිය විසින් ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙකුට සියලු සාධාරණ වේලාවන්හි දී යම් පරිශ්‍රයකට ඇතුළු වීමට සහ එහි හිමිකරු හෝ පදිංචිකරු මෙම අතුරු ව්‍යවස්ථාවන්හි විධිවිධාන වලට අනුකූලව ක්‍රියා කරන්නේදැයි පරීක්ෂා කර බැලීමට බලය ඇත්තේ ය.

(ii) එම පරිශ්‍රයේ හිමිකරු, පදිංචිකරු, භාරකරු, කළමනාකරු හෝ එහි වාසය කරන්නා වූ හෝ සේවය කරන්නා වූ යම් තැනැත්තෙක් ලේකම්ට හෝ යම් බලය ලත් නිලධාරියෙකුට අවශ්‍ය කරන තොරතුරු ඉදිරිපත් කළ යුත්තේ ය.

(iii) මෙම අතුරු ව්‍යවස්ථා යටතේ ලේකම්ට හෝ බලයලත් නිලධාරියෙකුට සිය බලතල භාවිතා කිරීමෙහිලා කිසිම තැනැත්තෙක් බාධා නොකළ යුත්තේ ය.

34. ගාල්ල මහා නගර සභාව විසින් කලින් කලට ගනු ලබන තීරණ අනුව, මෙම අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක කරන යම් බලයලත් නිලධාරියෙකුට දිරිගැන්වීම් පිරිනමනු ලැබිය හැකිය.

35. මෙම අතුරු ව්‍යවස්ථාවන්හි යම් විධිවිධානයක් උල්ලංඝනය කරන යම් තැනැත්තෙක් නගර සභා ආඥාපනත ප්‍රකාර වරදකට වරදකරු වන්නේ ය.

## අර්ථ නිරූපණය

36. මෙම අතුරු ව්‍යවස්ථාවන්හි කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,

**"අපද්‍රව්‍ය හෝ ඝන අපද්‍රව්‍ය''** යන්නෙන්, ඒවා ඉවත දැමූ තැනැත්තාට පරිභෝජන වටිනාකමක් නොමැති ද්‍රව්‍ය අදහස් වන අතර, රොඩු කසළ, වීථි ශුද්ධ කිරීමේ දී එකතුවන අපද්‍රව්‍ය, දුවිලි, පස්, මඩ සහ අළු ද අදහස් කෙරේ.

**" ඉදිකිරීම් අපද්‍රව්‍ය''** යන්නට ඉදි කිරීමේදී ගොඩනැගිලි ද්‍රව්‍ය භාවිතයෙන් ජනනය වන්නා වූ පස්, මඩ, දුවිලි හා සහ යම් ඉදිකිරීමක් කඩා දැමීමේ දී ජනනය වන්නා වූ ද්‍රව්‍යය ඇතුළත් වේ.

**''ආහාර අපද්‍රව්‍ය''** යන්නෙන් මිනිස් පරිභෝජනය සඳහා පාවිච්චියට ගත නොහැකි මස්, මාළු, කුකුල් මස්, බිත්තර, එළවළු පළතුරු සහ වෙනත් ආහාර ද්‍රව්‍ය අදහස් කෙරේ.

**"ආරෝග්‍ය ශාලාව''** යන්නෙන් අදහස් කරන්නේ යම් රෝගයකින් හෝ දුබලතාවයකින් පෙළෙන තැනැත්තන් හෝ සතුටින් පිළිගැනීම ඔවුන්ට සාත්තු කිරීම සහ ප්‍රතිකාර කිරීම සඳහා යොදා ගනු ලබන හෝ යොදා ගැනීමට අපේක්ෂා කරනු ලබන යම් පරිශ්‍රයක් (කුමන ආකාරයෙන් විස්තර කරනු ලැබූව ද) වන අතර සාත්තු නිවාසයක්, සායනයක්, වෛද්‍ය මධ්‍යස්ථානයක් මාතෘ නිවාස හා සත්ත්ව රෝහලක්/ සත්ත්ව සායන ඊට ඇතුළත් වේ.

**"උපද්‍රවකාරි අපද්‍රව්‍ය''** යන්නෙන් අදහස් කෙරෙන්නේ සායනික අපද්‍රව්‍ය, ශරීර කොටස්, වැදෑමස්, ආසාදනය වන සුළු හා අතිශයින්ම ආසාදනය වන සුළු අපද්‍රව්‍ය ඉවතලන බෙහෙතු ද්‍රව්‍යය හා උල් කටු ය.

**"උපද්‍රවකාරී අපද්‍රව්‍ය''** යන්නෙන් මහජන සෞඛ්‍යයට හෝ පරිසරයට හානිදායක වන විෂ සහිත, දැවෙන සුළු, ප්‍රතික්‍රියා දක්වන සුළු, රෝග කාරක, විකිරණ ශීලී ස්වභාවයේ අපද්‍රව්‍ය අදහස් කෙරේ.

**"එළවළු හා පළතුරු වෙළඳ සැල"** යන්නෙන් අදහස් කරන්නේ එළවළු හා පළතුරු ගබඩා කර ඇති හෝ විකිණීමට තබා ඇති ස්ථානයකි.

**''කාර්යාලය''** යන්නට 1954 අංක 19 දරන සාප්පු සහ කාර්යාල සේවා නියුක්තිකයන් පිළිබඳ පනතේ (129 වැනි අධිකාරිය) දී ඇති අර්ථයම ඇත.

**''කර්මාන්ත ශාලාව ''** යන්නට 1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥාපනතේ තිබෙන අර්ථයම සහ මහා නගර සභා ආඥා පනත යටතේ ගාල්ල මහා නගර සභාව විසින් කර්මාන්ත බදු අයකරන සියලු ව්‍යාපාර හා කර්මාණ්ත ශාලා අදාළ වන්නේ ය.

'' **කැනීම, ඉදිකිරීම හා කඩා දැමීම යන ක්‍රියාවක නියුතු සෑම තැනැත්තෙකු''** යන්නට සේවා යෝජකයෙකු විසින් එම සේවය සඳහා නියුක්ත කරනු ලැබූ යම් තැනැත්තෙකු ද ඇතුළත් වේ.

**"ජංගම වෙලෙන්දන්"** යනු තම භාන්ඩ හා සේවාවන් අලෙවිකිරීම සඳහා එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට යාමෙන් හෝ නම් කරන ලද ප්‍රදේශයක විකිනුම් කටයුතු සිදුකරන වීදි වෙලෙන්දන් යන්නයි.

**"පදික වෙලෙන්දන්"** යනුවෙන් අදහස් කරනු ලබන්නේ භාන්ඩ විකිනීමේ යෙදී සිටින අයෙකි. වීදි මංතීරු පදික වේදිකා අඩිපාර පදික මංතීරු පොදු උද්‍යාන මුහුදු වෙරල ගං ඉවුර ඇවිදින මංතීරු වෙනත් ආකාරයේ පොදු අවකාශයන් හෝ පෞද්ගලික ප්‍රදේශයක එදිනෙදා භාවිතයට අවශ්‍යය භාන්ඩ ඇඳුම්පැලදුම් ආහාර ද්‍රව්‍යය හෝ වෙලඳ භාන්ඩ හෝ සාමාන්‍යය ජනතාවට සේවාවන් සැපයීම වන අතර මෙය තාවකාලිකව ගොඩනගන ව්‍යහයක් තුල හෝ තැනින් තැනට යාමෙන් සහ සිදුකල හැකි අතර පදික වෙලෙන්දා වීදි වෙලෙන්දා යන්න සඳහා ප්‍රාදේශීයව සහ කලාපීය වශයෙන් විශේෂිත වියහැකි අනෙකුත් සියලුම සමාන පද ඇතුලත් වන අතර ව්‍යාකරන විචලනය සහ සංජානන ප්‍රකාශනයන් සියල්ල වීදි පදික වෙලෙන්දන් යන වචනයට අනුව වියයුතුය.

**''පදිංචිකරු''** යන්නෙන් අදහස් කෙරෙන්නේ සාප්පුවක හිමිකරු හෝ පදිංචිකරු හෝ ව්‍යාපාරයක හෝ කාර්යාලයක භාරකරු ය.

**" පාසල් සහ නෙකුත් අධ්‍යාපන ආයතන"** යනුවෙන් අදහස් වන්නේ යම් ආකරයකින් සිසුන් හට අධ්‍යාපනය ලබා දෙන රජයේ හෝ පෞදගලික පාසල්, උපකාරක පංති, මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන, පෙරපාසල්, පිරිවෙන්, සෙමනේරි, වෘතීය පුහුනු මධ්‍යස්ථාන, තෘතීක අධ්‍යාපනය ලබාදෙන ආයතන, විශ්වවිද්‍යාල, පුහුනු ආයතන යන සියල්ල වේ.

**"ප්‍රතිභාවිතා කරණීය අපද්‍රව්‍ය''** යන්නෙන් සේදීමෙන් විෂබීජ නැසීමෙන් හෝ වෙනත් ක්‍රමයකින් පිරිසිදු කිරීමෙන් පසුව උපයෝගී කරගත හැකි අපද්‍රව්‍ය අදහස් කෙරේ.

**"ප්‍රවාහනය''** යන්නෙන් මිනිස් සත්ත්ව හෝ යාන්ත්‍රික බලයකින් ක්‍රියා කරන යම් ආකාරයේ ප්‍රවාහන මාධ්‍යයක් යොදා ගනිමින් අපද්‍රව්‍ය එක්රැස් කරනු ලබන ස්ථානයේ සිට ඒවා සැකසීම, පිරියම් කිරීම හෝ බැහැරලීම සඳහා ඇති ස්ථානය වෙත ගෙනයාම අදහස් කෙරේ.

**''බක්කිය / බඳුන් හෝ වෙනත් බහාලුම්''** යන්නෙන් අතුරු ව්‍යවස්ථාවන්හි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව අපද්‍රව්‍ය ගබඩා කිරීම, මුදා හැරීම, එක්රැස් කිරීම හෝ

ප්‍රවාහනය කිරීම සඳහා භාවිතා කරනු ලබන යම් බක්කියක්, බඳුනක්, උරයක්, මල්ලක් හෝ වෙනත් බහාලුමක් අදහස් කෙරේ.

''**බලයලත් එක් රැස් කරන්නා**'' යන්නෙන් අපද්‍රව්‍ය එක් රැස් කිරීමට හෝ ලබා ගැනීමට කොමසාරිස් වරයාගෙන් අවසර පත්‍රයක් ලබාගන්නා තැනැත්තෙකු අදහස් කෙරේ.

" **බලයලත් නිලධාරී**'' යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථා යටතේ වන රාජකාරි ඉටු කිරීමට හෝ කරගෙන යාමට නගරාධිපති වරයා හෝ වරිය කොමසාරිස් වරයා හෝ වරිය විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙකු අදහස් කෙරේ.

"**බැහැරලීම**'' යන්නෙන් ප්‍රතිභාවිතා නොකරන ලද්දාවුත්. ප්‍රතිචක්‍රීකරණය නොකරන ලද්දා වුත්, සැකසුම් නොකරන ලද්දා වුත්, පිරියම් නොකරන ලද්දා වුත් සියලුම අපද්‍රව්‍ය ස්ථිරව රැඳවීමට අදහස් කරනු ලබන ඉඩමක මතුපිට හෝ අතුළත හෝ තැන්පත් කිරීම අදහස් කෙරේ.

"**හෝටලය**" යන්නෙන් නිදන පහසුකම් සහිතව හෝ රහිතව මුදල් ගෙවීම මත පරිභෝජනය සඳහා ආහාරපාන සහ / හෝ මධ්‍යසාර සපයනු ලබන ස්ථානයක් අදහස් කරේ. එයට ආපන ශාලාවක්, ආගන්තුක නිවාසයක්, ලැගුම්හලක්, තානායමක්, වන්දනාකරුවන්ගේ විශ්‍රාම ශාලාවක්, බත් කඩයක් හෝ හෝටලයකට සමාන ආකාරයෙන් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන යම් වෙනත් පරිශ්‍රයක් ද ඇතුළත් වේ.

"**දෛනික සංක්‍රමන ප්‍රජාව**" ලෙස හඳුන්වනු ලබන්නේ ගාල්ල මහනගර සභා සීමාව තුලට දෛනිකව විවිධ සේවාවන්, කාර්යයන් සහ සංචාරය සඳහා පැමිනෙන දේශීය සහ විදේශීය පුද්ගලයන් වේ.
"**මස්, මාළු, කුකුළු මස් හෝ බිත්තර වෙළඳ කුටිය**" යන්නෙන් අදහස් කෙරෙන්නේ මෙම ද්‍රව්‍ය අලෙවි කිරීමේ කාර්යය සඳහා ගබඩාකර ඇති හෝ අලෙවිය සඳහා තබා හෝ නිරාවරණය කර හෝ ඇති ස්ථානයකි.

"**මාරු කරන ස්ථානය**'' යන්නෙන් සභාව විසින් මේ කාර්යය සඳහා නියම කරනු ලබන ස්ථානයක් අදහස් කෙරෙන අතර ඒ ස්ථානයෙහි සිට යම් ප්‍රතිචක්‍රීකරණ, සැකසුම් කරන, පිරියම් කරන හෝ බැහැරලීම කරන පහසුකමක් වෙත අපද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමේ කාර්යක්ෂමභාවය වැඩිදියුණු කිරීමේ කාර්යය සඳහා අපද්‍රව්‍ය වඩා කුඩා ප්‍රමාණයේ වාහන වලින් වඩා ලොකු ප්‍රමාණයේ වාහන වලින් වඩා ලොකු ප්‍රමාණයේ වාහන වලට මාරු කිරීම එහිදී කෙරේ.

"**තැනැත්තා**'' යන්නෙන් සංස්ථාගත හෝ සංස්ථාගත නොවන සමාගමක් හෝ පුද්ගලයින්ගේ සමිතියක් හෝ මඩුල්ලක් අදහස් කෙරේ.

"**නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නා**'' යන්නෙන් බක්කිවලින් හෝ බහාලුම් වලින් අපද්‍රව්‍ය අතුගා දැමීම, එක්රැස් කිරීම, ලබා ගැනීම හෝ ඉවත් කිරීම සඳහා සභාව විසින් යොදවනු

ලැබූ සේවකයෙකු හෝ මේ කාර්යයන් ඉටුකිරීමට සභාව සමග කොන්ත්‍රාත්තුවකට ඇතුළු වී සිටින තැනැත්තෙකු අදහස් කෙරේ.

**"වෙන් කිරීම''** යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථාවන්හි යොදා ඇති ප්‍රභේදයන්ට අනුකූලව අපද්‍රව්‍ය විවිධ වර්ගවලට තෝරා වෙන් කිරීම අදහස් කෙරේ.

**" සැකසීම''** යන්නෙන් අපද්‍රව්‍ය ප්‍රයෝජනවත් නිපැයුමක් බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය අදහස් කෙරේ.

**"සභාව''** යන්නෙන් ගාල්ල මහා නගර සභාව අදහස් කෙරේ.

**''සාප්පුව''** යන්නෙන් අදහස් කෙරෙන්නේ තොග හෝ සිල්ලර වෙළඳාම සඳහා භාණ්ඩ තබා ඇති ස්ථානයක් වන අතර ආහාරපාන අලෙවියට තබා ඇති ස්ථානයක් සහ බාබර් සාප්පුවක් හෝ රූපලාවන්‍ය සැලෝන් එකක් පවත්වා ගෙන යනු ලබන ස්ථානයක් ද ඊට ඇතුළත් වේ.

**"නාගරික ප්‍රදේශය''යන්නෙන්** නගර සභා ආඥාපනත (252 අධිකාරිය) බලය යටතේ ප්‍රකාශයට පත් කරනු ලැබූ ප්‍රදේශය අදහස් කෙරේ.

**"සනීපාරක්ෂක බිම් පිරවුම''** යන්නෙන් ඒ හා ආශ්‍රිත සමාජයීය, සෞඛ්‍ය හා පාරිසරික බලපෑම් අවම කිරීමට ශ්‍රී ලංකාවේ පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව අපද්‍රව්‍ය භූමියකට අවසාන වශයෙන් බැහැර කරලීම අදහස් කෙරේ.

**"හිමිකරු හෝ පදිංචිකරු''** යන්නෙන් පරිශ්‍රයේ හිමිකරු හෝ හිමිකරු වෙනුවෙන් ඇටෝර්නි බලය දරන යම් තැනැත්තෙකු හෝ හිමිකරු විසින් සිය කර්මාන්තය, කර්මාන්ත ශාලාව, වත්ත කළමනාකරණයට පත්කරන ලද නියෝජිතයෙකු හෝ භාරකරුවෙකු හෝ කුලියට ලබා ගන්නා අයෙකු බදුකරුවෙකු හෝ අතුරු බදුකරුවෙකු ඇතුළත් වන අතර වෙනත් තැනැත්තෙකුගේ නියෝග යටතේ ක්‍රියා කරන කළමනාකරුවෙකු.

**උපලේඛනය 1**

ගාල්ල මහනගර සභාව විසින් නිර්දේශ කරනු ලබන ඝන අපද්‍රව්‍යය එක්රැස් කිරීමේ ක්‍රමවේදයන් මෙම උපලේඛනයට ඇතුලත් කල යුතුය.

**උපලේඛනය 2**

ගාල්ල මහනගර සභා සීමාව තුල ගාල්ල මහනගර සභාව විසින් අපද්‍රව්‍ය බැහැරලීම තහනම් කර ඇති ප්‍රදේශ මෙම උප ලේඛනය තුල දැක්විය යුතුය ( උදා - එනම් මෙම ලේඛනයේ දෙවන උපලේඛනයේ දක්වා ඇති ගාලු කොටුව වැනි නිස්චිත ප්‍රදේශ).

**උපලේඛනය 3**

බැහැරලීමට ඇති අපද්‍රව්‍යවල ස්වභාවය සැලකිල්ලට ගෙන සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාල්ල මහනගර සභාව විසින් නියම කරනු ලබන අපද්‍රව්‍යය බැහර කිරීමට නගර සභාවට හෝ ලියාපදිංචි නාගරික අපද්‍රව්‍ය එක් රැස් කරන්නාට ගෙවිය යුතු නියමිත ගාස්තු මෙහි ඇතුලත් කලයුතුය.

## උපලේඛනය 4

ගෘහස්ථ කසල ගණයට අයත් නොවන නිවාස පරිශ්‍රයන් හි ජනිත වන්නා වූ කසල වර්ග මෙම උපලේඛනය තුල ඇතුලත් කලයුතුය.

## උපලේඛනය 5

ගාල්ල මහනගර සභාව විසින් නිවාස පරිශ්‍රයන් වලින් ජනිත වන්නා වූ ගෘහස්ථ කසල සඳහා තාක්ෂණික පදනමක් යටතේ නියම කරනු ලැබූ නිශ්චිත බරකට අදාලව අයකරන මුදල් ප්‍රමානය මෙහි ඇතුලත් කලයුතුය.

## උපලේඛනය 6

උපද්‍රවකාරී අපද්‍රව්‍ය මොනවාද යන්න වෙන්වෙන් වශයෙන් මෙහි දැක්විය යුතු අතර ඒවා භාර ගැනීම සඳහා අයකරනු ලබන ගාස්තු මෙහි දැක්විය යුතුය. ( එනම් විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍යය හා අපද්‍රව්‍යය, සනීපාරක්ෂක අපද්‍රව්‍ය, සායනික අපද්‍රව්‍ය, ඉවතලන ඖෂධ වැනි ද්‍රව්‍යය කෘමිනාශක අඩංගුව තිබූ බෝතල් වැනි )

## උපලේඛනය 7

ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය. මොනවාද යන්න පිලිබඳව වෙන්වෙන්ව මෙහි සඳහන් කලයුතුය.

## උපලේඛනය 8

ගෑස්, විදුලිය, ජලය දුරකථන පහසුකම් හෝ වෙනත් පොදු පහසුකම් සැපයීම සඳහා යම් වීථියක්, පාරක් හෝ පොදු ස්ථානයක් කනින යම් තැනැත්තෙක් ගාල්ල මහ නගරසභාවේ කොමසාරිස් වරයාගෙන් ලිඛිතව පූර්ව අනුමැතිය ලබා ගැනීමට අදාල ආකෘතිය.

## උපලේඛනය 9

ගාල්ල මහනගර සභා සීමාවතුල ජංගම/ අවිධිමත් කසල එකතුකරන්නන්, කසල ප්‍රවාහනය කරන්නන් කසල එක්රැස් කරන්නන්, කසල ප්‍රතිචක්‍රීකරනය කරන්නන් සඳහා මහනගර සභාව විසින් වාර්ශිකව නිකුත් කරනු ලබන බලපත්‍රයක් ලබා දීමේ ආකෘතිය දැක්වෙන උපලේඛනය.

## උපලේඛනය 10

ගාල්ල මහනගර සභා සීමාව තුල ව්‍යාපාරයක් කරගෙන යන යම් තැනැත්තෙක් හෝ මහජනතාවගේ සහභාගීත්වය ඇතිව පොදු ආගමික, සමාජයීය, සංස්කෘතික, විනෝදාස්වාදය සඳහා පවත්වනු ලබන උත්සව, හෝ අධ්‍යාපනික ක්‍රියාකාරකමක් සංවිධානය කරන හා ක්‍රියාත්මක කරන යම් තැනැත්තෙක් අදාල ක්‍රියාකාර කම සිදුකිරීමට ප්‍රථම මහනගර සභාවෙන් අවසර ලබා ගැනීමේ ආකෘතිය

## උපලේඛනය 11

අංක 8 සිට 19 දක්වා වන අතුරු ව්‍යවස්ථාවන්හි විශේෂයෙන් සඳහන් කර නොමැති ගාල්ල මහනගර සභා සීමාව තුල ව්‍යාපාරයක් කරගෙන යන යම් තැනැත්තෙක් හෝ මහජනතාවගේ සහභාගීත්වය ඇතිව පොදු ආගමික, සමාජයීය, සංස්කෘතික, විනෝදාස්වාදය සඳහා පවත්වනු ලබන උත්සව , හෝ අධ්‍යාපනික ක්‍රියාකාරකමක් සංවිධානය කරන හා ක්‍රියාත්මක කරන යම් තැනැත්තෙක විසින් ගාල්ල මහනගර සභාව වෙත තැන්පත් කරනු ලබන දෙවන මුදල් තැන්පතුවට අදාලව අදාල ක්‍රියාකාරකමින් ජනනය වීමට අපේක්ෂිත ඇස්තමේන්තුගත අපද්‍රව්‍යය ප්‍රමානයට අනුකූලව අයකරනු ලබන මුදල මෙම ආකෘතීය තුල දැක්විය යුතුය. එමෙන්ම මිශ්‍ර කසල භාරදීමේදී අයකරන මිලගනන් ද වෙන්කල පසු භාරදෙන කසලවලට අයකරනු ලබන මිල ගනන් වෙන වෙනම දැක්විය යුතුය.